{සියලු ම හිමිකම් ඇවිරිණි/*All right Reserved*}

කලාප අධ්‍යාපන කාර්යාලය කළුතර Zonal Education Office kalutara කලාප අධ්‍යාපන කාර්යාලය කළුතර Zonal Education Office kalutara කලාප අධ්‍යාපන කාර්යාලය කළුතර Zonal Education Office kalutara කලාප අධ්‍යාපන කාර්යාලය කළුතර Zonal Education Office kalutara කලාප අධ්‍යාපන කාර්යාලය කළුතර Zonal Education Office kalutara කලාප අධ්‍යාපන කාර්යාලය කළුතර Zonal

කළුතර අධ්‍යාපන කලාපය

13 ශ්‍රේණිය - තෙවන වාර ඇගයීම

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2025

ව්‍යාපාර අධ්‍යයනය I

Business Studies I

32 | S | I

පැය දෙකයි

Two Hours

විභාග අංකය.....

උපදෙස්:-

- **සියලු** ම ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්තරයේ** ම සපයන්න
- **විභාග අංකය,** ඉහලින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- විභාග අංකය ඉහලින් ඇති තිත් ඉර මත පැහැදිලිව සටහන් කරන්න.
- අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.
- අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉර මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු **දෙක** බැගින් හිමිවේ.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

1 පත්‍රය සඳහා	
ප්‍රශ්න අංකය	ලකුණු
01-30	
31-50	
එකතුව	

	අත්සන	සංකේත අංකය
1 වන පරීක්ෂණය		
2 වන පරීක්ෂණය		
අති. ප්‍රධාන පරීක්ෂක		
ප්‍රධාන පරීක්ෂක		
ගණිත පරීක්ෂක		

1. ව්‍යාපාර ගති ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

   1) අවදානමක් තිබීම/ අරමුණක් සහිත වීම/ ආර්ථික කටයුත්තක් වීම
   2) මිනිස් අවශ්‍යතා සපුරාලීම/ ගනුදෙනු අඛණ්ඩව සිදුවීම/ ලාභයෙන් අභිප්‍රේරණය වීම
   3) අරමුණක් තිබීම/ සමාජ වගකීම ඉටුකිරීම/ වුවමනා නිර්මාණය වීම
   4) භාණ්ඩ හා සේවා ගනුදෙනු වීම/ අවදානමක් තිබීම/ ආර්ථික කටයුත්තක් වීම
   5) ආවස්ථික පිරිවැයක් දරා තිබීම/ සම්පත්වලට අගය එකතු කිරීම/ වුවමනා නිර්මාණය වීම

(.....)

2. ව්‍යාපාර පරිසරය හා සම්බන්ධ ප්‍රකාශන කිහිපයක් පහත දැක්වේ. අධ

   A. - සාර්ව පරිසරය ව්‍යාපාරයට පාලනය කල නොහැකි වීම.
   B. - ආසන්න පරිසර සාධක ව්‍යාපාරයට පාලනය කළ හැකි වීම.
   C. - සාර්ව පරිසර බලවේග අන්තර් සම්බන්ධතා වලින් යුක්ත වීම.
   D. - අභ්‍යන්තර පරිසර බලවේග ව්‍යාපාරයට ශක්තියක් ගෙනදේ.
   E. - ආදේශක නිෂ්පාදන මගින් ව්‍යාපාරවලට තර්ජන ඇති වේ.
   F. - සංවිධාන ව්‍යුහය මගින් ව්‍යාපාර වලට අවස්ථාව ඇති කරයි.
   G. - භාණ්ඩ යල් පැනීම හා තාක්ෂණය ශීඝ්‍රයෙන් වෙනස් වීම ගෝලීය පරිසරයේ උප සාධකයන්ය.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,

1) B,C,D,G 2) B,D,F,G 3) A,C,D,E 4) A,C,D,G 5) B,C,E,F

(……..)

දෙවෙනි පිටුව බලන්න

3. A ප්‍රකාශය: භාණ්ඩ හුවමාරු ක්‍රමයේ සිට අද දක්වා මුදල් භාවිතයේ ඇති වූ ක්‍රමික විකාශනයේ මුල්ම අවධිය ලෝහ වර්ග භාවිතයයි.
B ප්‍රකාශය: තොරතුරු හා ඩිජිටල් තාක්ෂණයේ දියුණුවත් සමග භෞතික මුදල් භාවිත කිරීමට අමතරව විවිධ විකල්ප බිහිවී ඇත.
ඉහත ප්‍රකාශ අතරින්,

1) A ප්‍රකාශය සත්‍ය වන අතර B ප්‍රකාශය අසත්‍ය වේ.
2) A මෙන්ම Bප්‍රකාශයද අසත්‍ය වේ.
3) A ප්‍රකාශය අසත්‍ය වන අතර B ප්‍රකාශය සත්‍ය වේ.
4) A සහ B ප්‍රකාශ සත්‍ය වන අතර B මගින් A තහවුරු වේ.
5) A සහ B සත්‍ය වුවත් එම ප්‍රකාශ දෙක අතර සම්බන්ධයක් නොමැත. (.....)

4. පහත දැක්වෙන්නේ රජය විසින් ව්‍යාපාර වලට මැදිහත් වන ආකාර සඳහා නිදසුන් කිහිපයකි.

A - වරිපනම් බදු අය කිරීම
B - ව්‍යාපාර නාම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම
C- පෞද්ගලික බස් රථ සඳහා නීතිරීති පැනවීම
D - අපද්‍රව්‍ය ඉවත් කිරීම
E - ආදාහනාගාර පවත්වා ගෙන යාම
F - මාර්ග නඩත්තුව

ඉහත දෑ අතුරින් පළාත් සභාවලට අදාළ ඒවා ඇතුළත් වරණය කුමක්ද?

1) B,C,F 2) A,C,E 3) B,C,E 4) C,D,F 5) C,E,F

(.....)

5. සාහිත්‍ය මාසය වෙනුවෙන් කොළඹ BMICH හි පවත්වන ලද පොත් ප්‍රදර්ශනයට සහභාගී වූ සමාධි පොත් මිලදී ගැනීමේදී ඒවායේ අන්තර්ගතයේ ගුණාත්මක බව පිළිබඳව දැඩි අවදානයක් යොමු කරමින් අලෙවි කුටි රැසකට පිවිස වෙළඳුන්ගෙන් තොරතුරු විමසමින් මිල ගණන් සසඳා බැලීමට ද විශාල කාලයක් ගත කර තිබුණි.

ඉහත සිද්ධිය තුලින් පිළිබිඹු වන්නේ මින් කුමක්ද?

1) පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය
2) සමාජය ගැන සැලකිලිමත් වීම
3) ආරක්ෂාව ගැන සැලකිලිමත් වීම
4) සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය
5) විචාරාත්මක දැනුවත්භාවය

(.....)

6. ව්‍යාපාර සංවිධාන වර්ග කිහිපයක් සහ ඒවාට ආවේණික අවාසි කිහිපයක් පහත වගුවේ දැක්වේ.

ව්‍යාපාර සංවිධාන	අවාසි
i. හවුල් ව්‍යාපාර	A. පාරිභෝගික ලැදියාව අඩු වීම
ii. සී/ස පොදු සමාගම්	B. සේවක ආධිපත්‍ය ඉහළ යාම
iii. රජයේ දෙපාර්තමේන්තු	C. කළමනාකරණය සංකීර්ණ වීම හා දුෂ්කර වීම
iv. සමූපකාර	D. විශාල පුරස්කාරයක් ගෙවීමට සිදුවීම
v. වරලත් ව්‍යාපාර	E. එක් සාමාජිකයකුගේ ක්‍රියාකලාපය නිසා සියලුම සාමාජිකයින් වගකීමට බැඳීම

ඉහත දී ඇති ව්‍යාපාර සංවිධාන අනුපිළිවෙළ අනුව ඊට වඩාත් ගැළපෙන අවාසිය නිවැරදිව ගළපා ඇති වරණය කුමක්ද?

1) A,D,B,E,C 2) E,C,B,A,D 3) A,E,B,C,D
4) E,C,A,B,D 5) D,E,A,B,C

(.....)

තුන් වෙනි පිටුව බලන්න
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

7. කාර්යක්ෂමව හා අවංක ලෙස කළමනාකරණ කටයුතු මෙහෙය වීම මගින් ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කරනු ලබන්නේ,

1) ගනුදෙනුකරු වෙනුවෙනි 2) කළමනාකරුවන් වෙනුවෙනි 3) රජය වෙනුවෙනි

4) අයිතිකරුවන් වෙනුවෙනි 5) සමාජය වෙනුවෙනි

(.....)

8. ව්‍යවසායකත්වය තනි ක්‍රියාවක් නොව, ක්‍රියාවලියකි. ව්‍යවසායකයාගේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා සම්පත් උපයෝගී කර ගනිමින් ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සිදු වන්නේ එම ක්‍රියාවලියේ කුමන පියවරේද?

1) අවශ්‍ය සම්පත් සම්පාදනය 2) යථාර්ථයක් බවට පත් කිරීම

3) සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම

4) නව්‍යතා සොයා ගැනීම 5) ප්‍රතිලාභ ලැබීම (.....)

9. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල කළමණාකරනය කරනු ලබන්නේ

1) ශ්‍රී ලංකා මහ බැංකුව විසින්ය.
2) කම්කරු කොමසාරිස්වරයා විසින්ය.
3) පාර්ලිමේන්තුව විසින්ය
4) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින්ය.
5) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින්ය. (.....)

10. යුරේකා සමූහ ව්‍යාපාරයේ අලෙවි කළමණාකරු විසින් එහි කළමණාකරන අධ්‍යක්ෂ වෙත 2025 අගෝස්තු මාසයේ අලෙවිය පිළිබඳ සාරාංශගත වාර්තාවක් විද්‍යුත් තැපෑල (e-mail) මගින් යොමුකර ඇත. ඉහත සිද්ධියට අදාල සන්නිවේදනය සිදු වූ ආකාරය නිවැරදිව දක්වා ඇත්තේ.

1) සිරස් - අවිධිමත්
2) පහළ සිට ඉහලට - අවිධිමත්
3) පහළ සිට ඉහලට - විධිමත්
4) ඉහළ සිට පහළට - විධිමත්
5) තිරස් - විධිමත් (.....)

11. කොළඹ වරාය නගරයේ පරිපාලන කටයුතු පවරා ඇත්තේ,

1) කොළඹ වරාය නගර ජනාධිපති කාර්ය සාධන බලකායට
2) මහ කොළඹ ආර්ථික කොමිෂන් සභාවට
3) කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාවට
4) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට
5) මහජන චීන සමූහාණ්ඩුවට (.....)

12. ශ්‍රී ලංකාව තුල පවත්වාගෙන ගිය විදේශීය මෘදුකාංග සමාගමක් ඉතා ශීඝ්‍ර තාක්ෂණික දියුණුව ද හේතුවෙන් ලංකාවේ පවත්වාගෙන ගිය කාර්යාලය වසාදමා තම මව්රටේ සිට online ක්‍රමයට (මං ගත ක්‍රමයට) මෙරට ව්‍යාපාර සමග ඔවුන්ට අවශ්‍ය සේවා සපයමින් ව්‍යාපාර කටයුතු සිදුකරයි.

ඉහත සිද්ධිය තුළින් වඩාත් හොඳි පිළබිඹු වන විද්‍යුත් වෙළඳ ආකෘතිය මින් කුමක්ද?

1) B 2 B
2) B 2 C
3) C 2 C
4) C 2 B
5) G 2 B (.....)

13. පහත දැක්වෙන්නේ කළමණාකරයේදී වැදගත් වන හැකියාවන් කිහිපයකි.

- සංවිධානයක අභ්‍යන්තර හා බාහිර පරිසරය පිළිබඳව ඇති දැක්ම.
- ගැටළු තේරුම් ගැනීමේ හා විසඳීමේ හැකියාව.
- දූරදර්ශී බව
- තීක්ෂණව සිතීමේ හැකියාව

ඉහත දෑ පොදුවේ හැඳින්විය හැක්කේ

1) නායකත්ව කුසලතා ලෙස
2) සංකල්පනාත්මක කුසලතා ලෙස
3) තාක්ෂණික කුසලතා ලෙස
4) අන්තර් පුද්ගල කුසලතා ලෙස
5) සන්නිවේදන කුසලතා ලෙස (.....)

14. කළමණාකරන සමීක්ෂයකට අනුව සී/ස සිවරාජා පෞද්ගලික සමාගමේ පවතින්නේ පටු පාලන අවකාශයක් බව හෙලිදරව් විය. මෙම ආයතනය සම්බන්ධයෙන් එළඹිය හැකි නිවැරදි නිගමනය මින් කුමක්ද?

1) සමීප සුපරීක්ෂණයක් පවතින බව.
2) පරිපාලන වියදම අඩු බව.
3) තීරණ ගැනීම වේගවත් බව.
4) කළමණාකරුවන් හා සහයකයන් අතර සම්බන්ධතාව අඩුවේ.
5) පහළට ගලා යන සන්නිවේදනය පහසු බව. (.....)

15. ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවෙන් ආනයනය කරන භාණ්ඩ සඳහා පැනවූ අන්‍යෝන්‍ය ගැලපුම් තීරුබදු අනුපාතය යලි සංශෝධනය කිරීමට ගත් තීරණය මත නිවැරදි බදු අනුපාතය වනුයේ,

1) 20% ක් වේ.
2) 33% ක් වේ.
3) 44% ක් වේ.
4) 60% ක් වේ.
5) 40% ක් වේ. (.....)

16. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පිහිටුවීමේ අරමුණක් නොවනුයේ,

1) ගෝලීය මූල්‍ය සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම.
2) ගෝලීය මූල්‍ය ස්ථායීතාව සහතික කිරීම.
3) ගෝලීය වෙළඳාමට පහසුකම් සලසමින් ගෝලීය විරැකියාව අවම කිරීම.
4) තිරසාර ආර්ථික සංවර්ධනය හා දරිද්‍රතාවය අවම කිරීම.
5) දෙවන ලෝක යුද්ධයෙන් විනාසයට පත්වූ ආර්ථිකය යලි ගොඩ නැංවීම. (.....)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki


17. සංවිධානයක් අනාගතයේ කවර තත්ත්වයකට පත් වන්නේ දැයි පැහැදිලි කරන ප්‍රකාශය වනුයේ,

1) දැක්ම
2) මෙහෙවර
3) පරමාර්ථ
4) අරමුණු
5) ප්‍රතිපත්ති (.....)

18. පහත දෑ අතුරින් ශ්‍රී ලංකා රජය විසින් මෑතකදී ප්‍රතිව්‍යුහගත කරන ලද දේශීය ණය වර්ගය වන්නේ,

1) භාණ්ඩාගාර බිල්පත්ය.
2) භාණ්ඩාගාර බැඳුම්කරය.
3) වාණිජ පත්‍රිකාය.
4) ණයකර ය.
5) බැංකුණය ය.. (.....)

19.



ඉහත රූප සටහනේ පාට කල කොටසින් නිරූපණය වනුයේ,

1) මුළු ලාභයයි.
2) මුළු ආදායමයි.
3) මුළු විචල්‍ය පිරිවැයයි.
4) මුළු දායකයයි.
5) මුළු ප්‍රතිලාභයයි. (.....)

20. අලෙවිකරණ හර සංකල්ප පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වනුයේ,

1) හිසරදයක් නම් පැනඩෝල් පිහිටුවීමට නිදසුනකි.
2) යුනිපාර්ක් විශ්ව විද්‍යාලය සිසුන්ට පාඨමාලා තෝරා ගැනීමේ උපදෙස් ලබා දීම, සහන මිලට ප්‍රවාහන හා නවාතැන් පහසුකම් ලබා දීම මෙන්ම පාඨමාලාව අවසානයේ රැකියා අවස්ථා සොයා ගැනීමට සිසුන්ට මග පෙන්වීම පිරිනැමුම වේ.
3) සී/ස සෙලින්කෝ රක්ෂණ සමාගම මෑතකදී හඳුන්වා දුන් ජීවිත රක්ෂණ ඔප්පුව පිළිබඳ නව ප්‍රචාරණ දැන්වීම ඉලක්ක වෙළඳ පොළ 75% ක් ආවරණය වූ බව එම සමාගමේ සමීක්ෂණ වාර්තා අනුව තහවුරු වීම හැඟීම වේ.
4) ස්වර්ණාභරණ ආයතනයකට ගෘහ භාණ්ඩ නිෂ්පාදන ආයතනයක් තරඟකරුවකු වේ.
5) පෑනක් මිලදී ගත් ශිෂ්‍යයකු එය නොකැඩී හොඳින් ලියවීම, බොඳ නොවීම, දිගු කාලයක් පැවතීම, කාබන් උතුරා නොයාම, විශේෂයෙන් අපේක්ෂා කල අතර එම පෑනෙන් ලියන විට ඔහු නොසිතූ පරිදි ප්‍රසන්න සුවඳක් වහනය වීම යනාදී ප්‍රකාශිත අප්‍රකාශිත සියල්ල ගුණත්වය වේ.

(.....)

21. ස්වභාවික ව්‍යසන, සිවිල් අරගල යනාදී විවිධ හේතු මත ආර්ථික හා සමාජීය වශයෙන් දැඩි පරිහානියකට පත්ව ඇති ඇෆ්ගනිස්තානයේ කුඩා දරුවන් උදෙසා සීමා සහිත යුනි ලීවර් සමාගම විසින් ක්ෂණික පෝෂ්‍යදායී ආහාරයක් සහනදායී මිලකට රට පුරා බෙදා හැරීමට තීරණය කරන ලදී. මෙහිදී එම සමාගම අනුගමනය කළ අලෙවිකරණ දර්ශනය වනුයේ,

1) නිෂ්පාදන සංකල්පයයි.
2) නිෂ්පාදිත සංකල්පයයි.
3) විකුණුම් සංකල්පයයි.
4) සමාජ අලෙවිකරණ සංකල්පයයි.
5) අලෙවිකරණ සංකල්පයයි.

(.....)

22. සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්ප හා ඒවාට අදාළ නිර්වචන පහත සඳහන් වේ. එම සංකල්ප නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

සංකල්පය	නිර්වචනය
1. සම්බන්ධතා අලෙවිකරණය	A. ව්‍යාපාර ආයතනයේ නියුක්ත සියලුම සේවකයන් ගනුදෙනුකරුවන්ට හොඳ සේවාවක් ලබා දීමට සක්‍රීයව එකතුවීම
2. සමෝධානික අලෙවිකරණය	B. අලෙවිකරණ මිශ්‍රයේ සියලුම විචල්‍යයන් ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක වීම.
3. අභ්‍යන්තර අලෙවිකරණය	C. අලෙවි වැඩසටහන් හා ක්‍රියා මාර්ග සැකසීමේදී සමාජ වගකීම් හා ආචාර ධර්ම පිළිබඳ අවධානය යොමු කිරීම.
4. කාර්යසාධන අලෙවිකරණය	D. ව්‍යාපාරයේ සියලුම ඇල්මැති පාර්ශව දීර්ඝකාලීනව දෙපාර්ශවයටම ඵලදායී සම්බන්ධතා ගොඩනගා ගැනීම.

1) 1-A, 2-B, 3-C, 4-D
2) 1-B, 2-A, 3-D, 4-C
3) 1-B, 2-D, 3-A, 4-C
4) 1-D, 2-C, 3-A, 4-B
5) 1-D, 2-B, 3-A, 4-C

(.....)

හත් වෙනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

23. සීමිත තරිදු ව්‍යාපාරයේ නිෂ්පාදිත මිශ්‍රය පහත පරිදි වේ, එහි දිග හා පළල පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ.

කිරි පැකට්	වැනිලා	චොක්ලට්	ස්ට්‍රෝබෙරි
අයිස් ක්‍රීම්	වැනිලා	චොක්ලට්	බ්ලූබෙරි	හේසල් නට්
බීම	දොඩම්	අඹ	අන්නාසි	මිශ්‍ර පළතුරු
චතුර බෝතල්	750ml	500ml	5L	19L

1) 15 , 19 2) 12,4 3) 15,4 4) 11,4 5) 4,4 (.....)

24. පහත දැක්වෙන කාණ්ඩ අතුරෙන් ප්‍රාග්ධන වෙළඳපොළට අදාළ උප වෙළඳපොලේ පමණක් දැක්වෙන කාණ්ඩය තෝරන්න.

1) කොටස් වෙළඳපොළ, භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ, දේශීය හා විදේශීය වෙළඳපොළ
2) භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ, සාංඝික බැඳුම්කර වෙළඳපොළ, කොටස් වෙළඳපොළ
3) භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ, භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ, වාණිජ පත්‍රිකා වෙළඳපොළ
4) භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ, සාංඝික බැඳුම්කර වෙළඳපොළ, වාණිජ පත්‍රිකා වෙළඳපොළ
5) භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ, භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ, සාංඝික බැඳුම්කර වෙළඳපොළ (.....)

25. ද්විතියික කොටස් වෙළඳපොළට අයත් වන්නේ,

1) මූලික ප්‍රසිද්ධ කොටස් නිකුතුවට අදාළ කටයුතු.
2) පරිණත කොටස් නිකුතුවට අදාළ කටයුතු.
3) මූලික ප්‍රසිද්ධ කොටස් නිකුතුවට හා පරිණත කොටස් නිකුතුවට අදාළ කටයුතු.
4) ලැයිස්තුගත සමාගමක් මගින් සිදුකරන ප්‍රසිද්ධ කොටස් නිකුතුවට අදාල කටයුතු.
5) ආයෝජකයන් එකිනෙකා අතර කොටස් ගනුදෙනු කරගැනීමට අදාල කටයුතු. (.....)

26. මානව සම්පත් කළමණාකරුවෙකු තම සැලසුම්කරණ කාර්යයයේදී අනුගමනය කලයුතු ප්‍රථම පියවර කුමක්ද?

1) අයදුම්පත් කැඳවීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීම
2) රැකියා විස්තරය, රැකියා පිරිවිතරය සකස් කිරීම
3) සේවක සැපයුම සේවක ඉල්ලුම ඇස්තමේන්තු කිරීම
4) අයදුම්කරුවන්ගේ ලැයිස්තුවක් සකස් කිරීම
5) වඩාත් සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම (.....)

27. පහත දැක්වෙන්නේ සේව්‍ය හා සේවකයින්ට අනුගමනය කළ හැකි කාර්මික ක්‍රියාමාර්ග කිහිපයකි

A. අතිකාල වැඩ වල යෙදීම
B. වැඩ මගහැරීම
C. පිකටින් කිරීම
D. සේවය අතහැර ගියා සේ සැලකීම
E. අකුරට වැඩ කිරීම
F. පිටමන් කිරීම
G. වර්ජන ආවරණ කිරීම
H. නිෂ්පාදන ස්ථානය මාරු කිරීම

ඉහත දෑ අතුරෙන් සේවකයින් සිදුකරන කාරමික ක්‍රියාමාර්ග වැලැක්වීම සඳහා සේවකයන්ට ගත හැකි ක්‍රියාමාර්ග පමණක් ඇතුලත් වරණය තෝරන්න.

1) ADFG 2)BEGH 3)DFGH 4)CDEF 5)BFGH (.....)

අට වෙනි පිටුව බලන්න

28. මූල්‍ය කළමණාකරන තීරණ වර්ගීකරණයට අනුව දිගුකාලීන ආයෝජන තීරණයක් නොවන්නේ මින් කුමක්ද ?

1) ව්‍යාපාරය නවීකරණය පිළිබඳ තීරණ
2) නැවත ස්ථාපිත කිරීම පිළිබඳ තීරණ
3) වෙළෙඳ තොගය පිළිබඳ තීරණ
4) ව්‍යාපාරය වැඩි දියුණු කිරීම පිළිබඳ තීරණ
5) ව්‍යාපාර විවිධාංගීකරණය පිළිබඳ තීරණ (.....)

29. ව්‍යාපාරයක දත්ත හා තොරතුරු කිහිපයක් පහත දැක්වේ

A. භාණ්ඩ මිළ
B. ඒකකයක බර
C. විකුණන ලද ඒකක ප්‍රමාණය
D. මුදල් ලදුපත්
E. බදු කේත
F. ගෙවීම් පත්‍රිකා
G. ශිෂ්‍ය වාර්තා පොත්
H. සේවක නම්
I. කාල සටහන්

ඉහත දෑ අතුරෙන් දත්ත පමණක් ඇතුලත් වරණය තෝරන්න

1) ABDEF 2)EFGHI 3)ABFHI 4)CDEFG 5)ABCEH (.....)

30. ව්‍යාපාර සැලැස්ම පිළිබඳව මග පෙන්වීමක් ලබා දීම සඳහා පිළියෙල කරණු ලබන්නේ,

1) අලෙවිකරණ සැලැස්ම 2) විධායක සාරාංශය 3) මෙහෙයුම් සැලැස්ම
4) මානව සම්පත් සැලැස්ම 5) මූල්‍ය සැලැස්ම (.....)

❖ අංක 31 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී **සුදුසු වචනය/ වචන** යොදා හිස්තැන් පුරවන්න.

31. අ) නිෂ්පාදන ක්‍රියාවලියේ අඛණ්ඩ වර්ධනය තුලින් .....සිදුවන අතර ඊට අමතරව මානව හා සමාජ දර්ශක වල දිගුකාලීන වර්ධනය ..... ලෙස හඳුන්වයි.

ආ) රාජ්‍ය සේවා පවත්නා මට්ටමින් පවත්වාගෙන යාමට ..... වියදම්ද රටක සංවර්ධනය උදෙසා ..... වියදම්ද රජයකට දැරීමට සිදුවේ.

32. අ) මිනිස් අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන ඒවා තෘප්තිමත් කිරීම සඳහා ..... මතු කරමින් ..... කරමින් නව්‍යතා සම්පාදනය ව්‍යවසායකත්වයි.

ආ) ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමණාකරනය ..... විසින්ද ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය පවත්වාගෙන යාම ..... විසින්ද සිදු කෙරේ.

33. අ) බදු වාසි ලබා ගැනීමේ අරමුණින් ඉන්දීය ආයෝජකයින් කණ්ඩායමක් මෙරට සමාගම් පනත යටතේ ..... ක් සංස්ථාපනය කර වියට්නාමයේ සිට ඇමරිකාව සමග ප්‍රතිඅපනයන කටයුතු කිරීමට තීරණය කර ඇති අතර එමගින් ..... වැනි ප්‍රතිලාභ ශ්‍රී ලංකාවට අත්කර ගත හැකි වේ.

ආ) රාජ්‍ය සමාගමක පූර්ණ කොටස් අයිතිය හෝ ..... ට වඩා වැඩි අයිතිය .....හෝ රජයේ අනුබද්ධ ආයතනයක් සතු වේ.

නව වෙනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

34. අ) මාධ්‍ය දෙකක් හෝ වැඩි ගණනක් පරිගණක භාවිතයෙන් ඒකාබද්ධ කිරීමේ පහසුකම් සලසන තාක්ෂණය ..... වේ. දුරස්ථ ස්ථාන වල සිටින දෙදෙනෙකු හෝ වැඩිදෙනෙක් ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයට පරිගණක ජාල ඔස්සේ සංවාද පැවැත්වීම..... වේ.

ආ) ආනයනය කරන ලද භාණ්ඩ වරාය තුලදීම වෙනස් වීම් වලට භාජනය කර හො නොකර අපනයන කිරීම ..... වන අතර, මෙහිදී ..... අය නොකරයි.

35. අ) නිෂ්පාදන ක්‍රියාවලියේ එක් අදියරක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය සියළු දේ එක් ස්ථානයක සිදුවන ආකාරයට පිරියත පිළියෙල කිරීම ..... ලෙස හැදින්වෙන අතර සමස් නිෂ්පාදන ක්‍රියාවලියේ එක් කාර්ය ස්ථානයකින් ඊලග කාර්ය ස්ථානයට රේඛීයව අනුපිළිලෙට ගලා යන ආකාරයට පිරියත සකස් කිරීම ..... ලෙස හැදින්වේ.

ආ) නිෂ්පාදනයේදී ගුණත්වය තහවුරු කර ගැනීම සඳහා නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අදියරක්ම විධිමත් පරීක්ෂාවකින් යුතුව සිදු කිරීමට ගනු ලබන ක්‍රියා පිලිවෙත් ..... ලෙස හැදින්වෙන අතර නිශ්චිත කාලසීමක් තුල ආයතනයක යෙදවුම් හා නිමවුම් අතර පවතින අනුපාතික සම්බන්ධතාවය ..... ලෙස හැදින්වේ.

36. අ) ආයතනයක තොග සම්බන්ධ මුලු පිරිවැය අවම වන පරිදි වරකට ඇණවුම් කළ යුතු තොග ඒකක ප්‍රමාණය ..... වන අතර, එහිදී ඇණවුම් කිරීමේ පිරිවැයත් ..... පිරිවැයත් එකින් එකට සමාන විය යුතුයි.

ආ) නිෂ්පාදනයේ ..... හා ..... මැනීමේ වැදගත් මිණුමක් ලෙස ඵලදායිතාව යොදා ගත හැකිය.

37. අ) භාණ්ඩයක සංවර්ධන අදියර ආරම්භ වන්නේ නව භාණ්ඩය පිළිබඳ ..... උත්පාදනයත් සමග වන අතර මෙම අදියරේදී ..... නොමැති අතර පර්යේෂණ හා සංවර්ධන වියදම් දරයි.

ආ) ඇසුරුමක මූලිකම කාර්යය භාණ්ඩයකට ..... ලබා දීම වුවත් වර්ථමානයේදී එය ..... උපකරනයක් ලෙසද භාවිත කරයි.

38. අ) ව්‍යාපාරයක් සතු අරමුදල් ව්‍යාපාරය තුල හෝ පිටත වත්කම් වල හෝ යෙදවීම ..... වන අතර ඒ සඳහා ගන්නා තීරණ ..... ලෙස හැදින්වේ.

ආ) තොගය විකුණුම් බවට පත්වීමේ සීඝ්‍රතාව ප්‍රමාණාත්මකව දැක්වෙන අනුපාතය ..... ලෙස හඳුන්වන අතර, ව්‍යාපාරයේ හිමිකරු ප්‍රාග්ධනයට වඩා ණය ප්‍රාග්ධනය ඉහල අගයක පවතී නම් එය ..... තෝලන තත්වයක් ලෙස හඳුන්වයි.

39. අ) වෘත්තීය සමිති පිහිටුවිය නොහැකි සේවා දායක කණ්ඩායම් ලෙස ..... නිලධාරීන් හා ..... නිලධාරීන් සඳහන් කළ හැකිය.

ආ) සංවේතන කළමනාකරණය යන්නෙන් අදහස් වන්නේ වේතන, ... හා අනෙකුත් ප්‍රතිලාභ ඇතුලත් ගෙවීම් පද්ධතියක් සම්පාදනය ..... හා පවත්වාගෙන යාමට අදාල මානව සම්පත් කළමණාකරන කාර්යයි.

40. අ) පුද්ගලයෙකුගේ හෝ සංවිධානයක හෝ අවශ්‍යතාවක් හෝ වුවමනාවක් ඉටුකළ හැකි නිෂ්පාදියක් පිළිබඳව ව්‍යවසායකයෙකු තුල ඇතිවන සිතුවිල්ල ව්‍යාපාර ..... ලෙසද, ව්‍යාපාර අරමුණු හා පරමාර්ථද ඒවා ලගා කර ගන්නා ක්‍රමෝපායන්ද විස්තර කෙරෙන ලේඛනය ..... ලෙස හඳුන්වයි.

ආ) ශ්‍රී ලංකාවේ වර්ථමාන ජනගහණය ..... ක්ද, ජනගහණ වර්ධන අනුපාතය ..... ක්ද වේ.

❖ 41 සිට 50 තෙක් ප්‍රශ්න වලට **නිශ්චිත පිළිතුරු** සපයන්න

41. ව්‍යවසායකත්වය තුලින් අත්වන ආයතනික ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න.

1) .....
2) .....
3) .....
4) .....

42. ඇසුරුමෙන් නිෂ්පාදිතයට ලැබෙන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න.

1) .....
2) .....
3) .....
4) .....

43. ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් නොමැති අවස්ථාවක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරයෙකුට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග හතරක් නම් කරන්න.

1) .....
2) .....
3) .....
4) .....

44. ශ්‍රී ලංකාවේ ස්ථාපිත විශේෂිත මූල්‍ය ආයතන හතරක් සඳහන් කරන්න.

1) .....
2) .....
3) .....
4) .....

45. පරිවාස කාලය තුල සේවකයෙක් සිය කටයුතු නිසි පරිදි ඉටු නොකිරීම නිසා කළමණාකාරිත්වයට ගත හැකි ක්‍රියා මාර්ග හතරක් සඳහන් කරන්න.

1) .....
2) .....
3) .....
4) .....

එකොළොස් වෙනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

46. පහත දී ඇති තොරතුරු තාක්ෂණය ආශ්‍රිත කෙටි යෙදුම් වල දිගු නාමය ලියන්න.

1) AI : .....
2) WWW :.....
3) GPS :.....
4) WAN :…..

47. ස්වයංක්‍රීය බැංකු සේවා නිසා බැංකු වලට අත්වන වාසි හතරක් සඳහන් කරන්න.

1) .....
2) .....
3) .....
4) .....

48. කෘතිම බුද්ධිය (Artificial Intelligence) (AI) භාවිතයන් හතරක් සඳහන් කරන්න.

1) .....
2) .....
3) .....
4) .....

49. විදේශ වෙළෙඳාම සඳහා පදනම් වී ඇති සාධක හතරක් සඳහන් කරන්න.

1) .....
2) .....
3) .....
4) .....

50. ව්‍යාපාර සැලැස්මේ කොටසක් වන ‘‘මෙහෙයුම් සැලැස්මේ’’ අන්තර්ගත විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

1) .....
2) .....
3) .....
4) .....

{සියලු ම හිමිකම් ඇවිරිණි/All right Reserved}

කලාප අධ්‍යාපන කාර්යාලය කළුතර Zonal Education Office kalutara කලාප අධ්‍යාපන කාර්යාලය කළුතර Zonal Education Office kalutara කලාප අධ්‍යාපන කාර්යාලය කළුතර Zonal Education Office kalutara කලාප අධ්‍යාපන කාර්යාලය කළුතර Zonal Education Office kalutara කලාප අධ්‍යාපන කාර්යාලය කළුතර Zonal Education Office kalutara කලාප අධ්‍යාපන කාර්යාලය කළුතර Zonal Educatio

කළුතර අධ්‍යාපන කලාපය

13 ශ්‍රේණිය - තෙවන වාර ඇගයීම

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)විභාගය 2025

ව්‍යාපාර අධ්‍යයනය II **Business Studies II**	**33**	**S**	**II**	පැය තුනයි **Three Hours**

උපදෙස්

- ❖ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- ❖ අමතර කියවීම් කාලය විනාඩි 10.

I කොටස

1. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම උපාධිධාරියෙකු වූ අවන්ත නානායක්කාර මේ වන විට ප්‍රසිද්ධ සහ දක්ෂ ව්‍යාපාරිකයකු වේ. ඔහු තේ වතු කිහිපයක හා තේ කර්මාන්ත ශාලාවක හිමිකරුවෙකි. මොහු යටතේ සේවකයින් 1000 කට නොඅඩු ප්‍රමාණයක් සේවය කරති. මොහු Awantha tea (pvt) Ltd නමින් ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලබයි. අවන්ත ඔහුගේ ව්‍යවසායකත්ව හැකියා ප්‍රයෝජනයට ගනිමින් තේ මගින් විවිධ නිෂ්පාදන නව්‍ය ආකාරයට ඉදිරිපත් කිරීමට ඔහු පියවර ගනියි. ඔහුගේ නව්‍යතම අදහස වන්නේ කොළජන් අඩංගු ටොෆියක් නිෂ්පාදනය කිරීමයි. සමේ පැහැය පිළිබඳ උනන්දු වන තරුණ හා වැඩිහිටි කාන්තාවන් ආකර්ෂණය කර ගැනීම තුලින් තම වෙළඳපොළ කොටස උපරිම කිරීම ඔහුගේ අරමුණයි.

ඔහුගේ නිෂ්පාදන ඔහුගේම රථ වාහන යොදා ගනිමින් දිවයින පුරා තොග හා සිල්ලර වෙළඳසැල් වලට බෙදාහරිනු ලැබේ. දැනටමත් තේ රටවල් කිහිපයකට අපනයනය කරන අතර ඔහුගේ නවතම නිෂ්පාදනය වන කොලජන් අඩංගු ටොෆියද දේශීය මෙන්ම විදේශීය වෙළඳ පොළට ද ඉදිරිපත් කිරීමට ඔහු සූදානමින් සිටියි.මීට අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට ඔහු බැංකු ණයක් ද ලබා ගැනීමට කටයුතු කර ඇත.

i. (අ) ඉහත නිෂ්පාදන ක්‍රියාවලිය නිෂ්පාදනයේ ස්වභාවය අනුව වර්ග කර ඊට නිදසුන් දක්වන්න. (ලකුණු 2)

(ආ) වාණිජ්‍යයේ කොටස් නම් කර සිද්ධිය ඇසුරෙන් එය පැහැදිලි කරන්න. (ලකුණු 2)

ii. (අ) ඉහත ව්‍යාපාරයට ඇති ශක්තියක් හා අවස්ථාවක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) මෙවැනි ව්‍යාපාර වලට මුහුණ පෑමට සිදුවන හදිසි අවදානම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

iii. (අ) මෙම ව්‍යාපාරය නිරත වන ප්‍රධාන ව්‍යාපාර කටයුතු දෙක නම් කරන්න. (ලකුණු 2)
(ආ) ඔහු පවත්වා ගෙන යන ව්‍යාපාර සංවිධානයට පමණක්ම සුවිශේෂ වූ ලක්ෂණ 4 ක් නම් කරන්න. (ලකුණු 2)

iv. මෙම නිෂ්පාදන වලට ඔහු ප්‍රමිති සහතිකයක් ලබා ගැනීමට අදහස් කරයි.

(අ) ප්‍රමිතියක් යන්න හඳුන්වන්න. (ලකුණු 2)

(ආ) මෙම නිෂපාදිත සඳහා ලබා ගත හැකි ප්‍රමිත වර්ග 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

v. (අ) අවන්තගේ ව්‍යවසායකත්ව කුසලතා මගින් ඔහුට හා සමාජයට ලැබෙන ප්‍රතිලාභ දෙක බැගින් ලියන්න. (ලකුණු 2)
(ආ) වෙනත් මූල්‍ය සම්පාදන මාර්ගයකට සාපේක්ෂව අවන්ත බැංකු ණයක් ලබා ගැනීමෙන් ඔහුට ලැබෙන ප්‍රතිලාභ 4 ක් නම් කරන්න. (ලකුණු 2)

(මුළු ලකුණු 20)

2. ඉවතලන ප්ලාස්ටික් හා ඉවතලන රෙදි කැබලි එකතුතර විසිතුරු මල් බඳුන්, පාපිසි, බිත්ති සැරසිලි, සැකසීමේ ව්‍යාපාරයක් ආරම්භ කල පැතුම් සිය නිෂ්පාදිත පරිසර හිතකාමී ලෙස සකස් කිරීමටත් ඒ සඳහා පරිසර හිතකාමී බලශක්ති භාවිතයටත් උත්සහ ගනියි. ක්‍රම ක්‍රමයෙන් ව්‍යාපාරය දියුණු වන නිසා එම ප්‍රදේශයේම ජීවත් වන තම පාසල් මිතුරියන් සිව් දෙනෙකු ද සේවයට බඳවා ගන්නා ලදී. රජයේ නීති වලට අනුගත වෙමින් පැතුම් ව්‍යාපාර කටයුතු කිරීමට වග බලා ගනියි.

i. (අ) මෙම ව්‍යාපාරයට අනුව ඇය වැඩිපුර ම දායක වන තිරසර සංවර්ධනයේ කුළුන නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) එම සංකල්පය පැහැදිලි කිරීමට පැතුම් අනුගමනය කරන ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

ii. (අ) පැතුම්ගේ ව්‍යාපාරයට ආර්ථික තිරසර බව වෙනුවෙන් කටයුතු කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග හතරක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) මෙම ව්‍යාපාරය 4R සංකල්පයෙන් කුමන සංකල්පයක් නියෝජනය කරයි ද? සිද්ධිය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

iii. (අ) "සමාජ වගකීම, ව්‍යාපාර වල සැහවුණු ප්‍රචාරණයකි". මෙම අදහස පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) "ව්‍යාපාර ආචාර ධර්ම කොතරම් වැදගත් වුවත් ඇතැම් ව්‍යාපාර එම ආචාර ධර්ම කෙරෙහි එතරම් සැලකිලිමත් නොවේ." හේතු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

iv. (අ) පාරිභොගික ආරක්ෂණය යන්න හඳුන්වා එය පාරිභෝගිකයාට වැදගත් වීමට හේතු දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) ආනයන තීරුබදු ඉහල නැංවීම තුලින් දේශීය ව්‍යාපාර වලට අත්වන වාසි හා අවාසි දෙක බැගින් ලියන්න. (ලකුණු 2)

v. (අ) වරලත් ව්‍යාපාර ක්‍රමය ක්‍රියාත්මක කල හැකි ව්‍යාපාර සන්ධාන වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) වරලත් ව්‍යාපාරයක් ව්‍යාපාර සංයෝජනයකින් වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 2)

(මුළු ලකුණු 20)

3. ආනයනික බදු යනු රජයක තීරණාත්මක ආදායම් මාර්ගයකි. රජය විසින් රටක ආනයනික බදු ඉහල නැංවීම මගින් අපේක්ෂා කරනු ලබන විවිධ අභිමතාර්ථයන් ඇත. රජයේ මෙම ක්‍රියාමාර්ගය මගින් පහත පාර්ශවයන්ට ඇතිවිය හැකි බලපෑම් දෙක බැගින් ලියන්න.

i. (අ) දේශීය කර්මාන්ත කරුවන්ට
රජයට (ලකුණු 2)

(ආ) භාණ්ඩ ආනයනය කරන අවස්ථාවේ ආනයනකරුවෙකුට ගෙවීමට සිදුවන බදු වර්ග දෙකක් ලියන්න. (ලකුණු 2)

ii. රාජ්‍ය ව්‍යවසායන් දීර්ඝ කාලයක් පුරාවට රටවල සමාජ ආර්ථික සංවර්ධනයට අදාලව ප්‍රධාන භූමිකාවක් ඉටු කරන අතර වර්ථමානයෙහිද එහි කාර්යභාරය අවප්‍රමාණය වී නොමැත.

(අ) රාජ්‍ය හිමිකාරීත්වය යටතේ ව්‍යාපාර පවත්වාගෙන යා යුත්තේ ඇයි දැයි කරුණු 4ක් ලියන්න (ලකුණු 2)

(ආ) ශ්‍රී ලංකා රජය ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා මෑතකදී ගෙන ඇති ක්‍රියාමාර්ග 4ක් නම් කරන්න. (ලකුණු 2)

iii. "ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාවය" නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 6 ශ්‍රේණියේ සිට විෂය මාලාවට ඇතුලත් කර ඇත.

(අ) මූල්‍ය සාක්ෂරතාවය යනු කුමක්ද? (ලකුණු 2)

තුන් වෙනිපිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

(ආ) "මූල්‍ය සාක්ෂරතාවය හා ව්‍යවසායකත්වය අතර පවතින්නේ ධන සහ සම්බන්ධතාවයකි" මෙම ප්‍රකාශය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)

iv. රාජගිරිය සම්පත් බැංකු ශාඛාවේ ජංගම ගිණුම් හිමි වරුණ සමරණායක අප ව්‍යාපාරයේ ඉතාමත් විශ්වාසවන්ත සැපයුම් කරුවෙකි. ඔහුට රු. 50,000 ක චෙක්පතක් ලිවීමට අවශ්‍ය බව අප ව්‍යාපාරයේ ගිණුම් ලිපිකාරිනියක් වන චතුරිකා පැවසූ අතර එය ලංකා බැංකු පානදුර ශාඛාවේ ජංගම ගිණුමෙන් සිදුකරනලදී.

(අ) මෙම චෙක්පතට උපරිම ආරක්ෂාව සැලසෙන පරිදි රේඛනය කරන ආකාරය දක්වන්න.

(ලකුණු 2)

(ආ) චෙක්පතක චුම්භක අක්ෂර හැඳුනුම් තීරුවේ ඇති අංක ඛාණ්ඩ තුන පිළිවෙලින් දක්වන්න. (ලකුණු 2)

v.

(අ) චෙක්පත් පිටසන් කල යුතු අවස්ථා 2ක් ලියන්න. (ලකුණු 2)

(ආ) පිටසන විධිමත් වීමට අනුගමනය කල යුතු රීති 2 ක් ලියන්න.

(ලකුණු 2)

(මුළු ලකුණු 20)

4. රක්ෂණය යනු අවදානම් ඒකරාශී කිරීම වුවද සියලු අවදානම් රක්ෂණය කල නොහැක.

i. (අ) රක්ෂණය කල හැකි අවදානම් වල තිබිය යුතු ලක්ෂණ 4 ක් ලියන්න. (ලකුණු 2)

(ආ) රක්ෂණයෙන් ව්‍යාපාරයකට අත්වන ප්‍රතිලාභ 2ක් ලියන්න. (ලකුණු 2)

ii. (අ) පහත එක් එක් අවස්ථාවල දී විකිණීම හෝ මිලදී ගැනීම සඳහා වඩා සුදුසුම ක්‍රමය කුමක්ද?

1. පුද්ගලයකු සතු පෞරාණික චිත්‍ර සහ භාණ්ඩ එකතුවක්
2. රෝහල් සඳහා ශල්‍යකර්ම ඇඳන් 1000 ක්මිලදී ගැනීම. (ලකුණු 2)

(ආ) මෙරට ප්‍රවාහන කටයුතු වඩා ඵලදායී කිරීමට හා වැඩි දියුණු කිරීමට රජය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග 4ක දක්වන්න. (ලකුණු 2)

iii. "තාක්ෂණික හා වෘත්තීය විෂය ධාරාවේ විෂය මාලා සංශෝධනය වියයුතු බව" අධ්‍යාපන ඇමතිතුමිය පසුගිය ජූලි 9 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කල අතර ඒ පිළිබඳව ජාතික අධ්‍යාපන ආයතනය ඇනුවත් කර ඇති බවත් ඒ සඳහා අවශ්‍ය විද්‍යාගාර පහසුකම් දැනටමත් සිදුකරමින් පවතින බවත් එතුමිය වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.

(අ) මෙම ප්‍රකාශය ඇසුරින් පහත සන්නිවේදන මූලිකාංග සඳහා උදාහරණ සපයන්න.

1. යවන්නා
2. පණිවුඩය
3. මාධ්‍ය
4. ලබන්නා (ලකුණු 2)

(ආ) මෙම පණිවුඩය පාර්ලිමේන්තුව තුල ලිඛිතව සඳහන් වන ලේඛනය කුමක්ද? (ලකුණු 2)

iv. (අ) ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා යෝජනා 4ක් ලියන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාරයකට ප්‍රවාහන සැපයුම් සේවා අවශ්‍යවන හේතු 4ක් ලියන්න. (ලකුණු 2)

v. (අ) විදේශ වෙළඳ කලාපයක් යනු කුමක්ද? (ලකුණු 2)

vi. (ආ) අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් 4 ක් ලියන්න. (ලකුණු 2)

(මුළු ලකුණු 20)

II කොටස

5. කළුතර ප්‍රදේශයේ පිහිටි වාණිජ බැංකුවක නව කළමණාකරු ලෙස වැඩබාරගත් කමල් සිරිවර්ධන මහතා විසින් පවත්වන ලද පළමු කාර්ය මණ්ඩල රැස්වීමේදී සිදු කල සාකච්ඡාවෙන් උපුටාගත් කොටස් පහතින් දැක්වේ.

අප සියළුම දෙනා ගනුදෙනු කරුවන්ට ප්‍රශස්ථම දේ අත් කර දීම උදෙසා මනා වගකීමෙන් හා ඉහළ ඵලදායීතාවකින් යුතුව කටයුතු කිරීමෙන් අප බැංකුවේ දැක්ම යථාර්ථයක් කර ගැනීම සිහිනයක් නොවන බව මා තරයේම විශ්වාස කරන අතර ඒ සඳහා අප සියළු දෙනා කැපවී කටයුතු කරමු. මා ඇතැම් අවස්ථාවල මාගේ තීරණ මත කටයුතු කල ද, එහෙත් සෑම විටම එලෙස ක්‍රියා නොකරන අතර අවශ්‍ය සෑම අවස්ථාවක දීම කළමනාකරණ මණ්ඩලය මෙන්ම ඔබ සැමගේ අදහස් පිළිබඳඅවධානය යොමු කරමින් කටයුතු කිරීමට ද බලාපොරොත්තු වෙමි.

i. (අ) ඵලදායීතාව යන්න හඳුන්වා, ඵලදායිතා වර්ධනයට අදාල ජපන් 5 S සංකල්පය නම් කරන්න.

(ලකුණු 3)

(ආ) දැක්ම යනු කුමක්දැයි පැහැදිලි කර වාණිජ බැංකුවකට උචිත දැක්මක් යෝජනා කරන්න.

(ලකුණු 1)

ii. (අ) බැංකු කළමණාකරුගේ ඒකාධිපති නායකත්ව ශෛලිය හා ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලිය මතු කරවන සිද්ධියේ සඳහන් හේතු වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) "මාගේ එකම සම්පත ඔබලා බව" පැවසීමෙන් කළමනාකරු සතු කවර කළමනාකරණ කුසලතාවයක් මතු වේද? එවැනි කුසලතා සහිත පුද්ගලයෙකු සතු ගුණාංග 3ක් සඳහන් කරන්න. (ලකුණු 2)

iii. (අ) ඉදිරි පෝෂණ පාලනය හා සහගාමී පාලනය කෙටියෙන් පැහැදිලි කර ඒ සඳහා ඉහක සිද්ධියෙන් නිදසුන් ගෙන හැර දක්වන්න. (ලකුණු 2)

(ආ) 1) වගකීම හා වගවීම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 1)

2) නායකයා හා කළමනාකරු අතර මූලික වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 1)

iv. (අ) රෝහලක් ඉදිකිරීමේදී හා එහි සෞඛ්‍ය සේවය සැපයීමේ දී අනුගමනය කරන පිරියත සැලසුම් එකිනෙකට වෙනස් වේ. ඒවා නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) 1) නිෂ්පාදන ආයතනයකට අවශ්‍ය ද්‍රව්‍ය තොග මිලදී ගැනීමේ දී අවධානය යොමු කල යුතු මූලික සාධක 4 ක් නම් කරන්න.

(ලකුණු 1)

2) ABC විශ්ලේෂණ ක්‍රමයේදී A කාණ්ඩය යටතේ වර්ග කරන තොග හා C කාණ්ඩය යටතේ වර්ග කරන තොග පාලනය සඳහා වඩාත් උචිත තොග පාලන ක්‍රමය වෙන වෙනම සඳහන් කරන්න.

(ලකුණු 1)

v. (අ) නිෂ්පාදිතයක් ඉහළම තත්වයක් අත්පත් කර ගැනීමට එහි අන්තර්ගත විය යුතු අංගෝපාංග 4 ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ආරක්ෂිත තොගය පවත්වා ගතනොහැකි වීමෙන් අත්විය හැකි ප්‍රතිවිපාත 4 ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(මුළු ලකුණු 20)

පස් වෙනි පිටුව බලන්න

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

6. ලොවට ඩෙනිම් කලිසම් හඳුන්වා දුන් Levis (R) සමාගම සිය වෙබ් අඩවිය තුල අතත්‍ය ගැලපුම් කාමරයක් ද (Virtual Fiton Room) පවත්වා ගනිමින් ඒ ඒ ගනුදෙනු කරුවන්ටජීවිතකාලවිටිනාකමක් ලබා දෙමින් සිය නිෂ්පාදන කටයුතු ලොව පුරා ව්‍යාප්ත කරමින් විවිධ රටවල්, භාවිත කරන්නන්ගේ ආකල්ප, විවිධ වෘත්තිකයන්, විවිධ සමාජ පන්ති නියෝජනය වන පරිදි ඩෙනිම් කලිසම් පෙළක් සමස්ථ වෙළඳ පොළේ ඒ ඒ ගනුදෙනු කරු පදනම් කරගෙනමෙන්මසමස්ථ වෙළඳ පොළ තොරතුරු හඳුන්වා දෙන ලදී. තවද සිය නිෂ්පාදිතය විවිධාංගීකරණයට ලක් කරමින් පාවහන්, හිස්වැසුම් හා ගමන් මලු නිෂ්පාදනය ද ඇරඹූ මෙම සමාගම විකුණුම් හා ලාභ උපරිම මට්ටමට පත්කර ගනිමින් ගුණත්වය අතින් වෙළඳ පොළ බලය ද තහවුරු කරමින් සිටින හෙයින් ඉතා ඉහල මිලක් ද අය කරමින් ඩෙනිම් නිෂ්පාදනයේ ලොව කීර්තිමත් ම සමාගමක් බවට පත්වී ඇත. වක්‍ර බෙදාහැරීමට වඩා සෘජු බෙදාහැරීමට ප්‍රමුඛතාව දක්වන මෙම සමාගම ප්‍රවර්ධන කටයුතු වලදී සෘජු අලෙවිකරණ උපාය මාර්ග සඳහා වැඩි වැදගත්කමක් දී තිබේ.

i. (අ) මෙම සමාගම අනුගමනය කල හැකි අලෙවිකරණ දර්ශනය නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) 1) මෙම සමාගමේ වෙළඳ නාමය වෙන සමාගමකට අනුකරණය කල හැකි ද, එයට හේතුව පැහැදිලි කරන්න.

(ලකුණු 1)

2) සන්නම් වර්ග නම් කර මෙම සන්නමඅයත් වන්නේ කුමන වර්ගයකට දැයි පැහැදිලි කරන්න. (ලකුණු 1)

ii. (අ) මෙම සමාගම ඉලක්ක වෙළඳ පොළ හඳුනා ගැනීම සඳහා වෙළඳ පොළ බණ්ඩනයේ දී භාවිත කර ඇති පදනම් සිද්ධිය ඇසුරින් නිදසුන් සහිතව දක්වන්න. (ලකුණු 2)

(ආ) ඉහත ආයතනයේ නිෂ්පාදිත ශ්‍රිතයේ පළල නිදසුන් සහිතව දක්වා, මෙම ආයතනයේ මිල කිරීමේ පරමාර්ථය සඳහන් කරන්න. (ලකුණු 2)

iii. (අ) බෙදාහැරීමේ මාර්ගයක් තීරණය කිරීමේදී සලකා බලන සාධක නම් කර, පාරිභෝගික භාණ්ඩයක් බෙදා හැරීමේදී ක්‍රියාත්මක වන වක්‍ර මාර්ග සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ප්‍රවර්ධනය යන්න නිදසුන් සහිත ව හඳුන්වා, මෙම සමාගම දියත් කරන ප්‍රවර්ධන ක්‍රමය යටතේ අනුගමනය කල හැකි උපායමාර්ග 2 ක් සඳහන් කරන්න. (ලකුණු 2)

iv. (අ) ඉහත සමාගම නිෂ්පාදනය කරන භාණ්ඩය කවර පාරිභෝගික භාණ්ඩයක් දැයි නම් කර එම සමාගම භාවිතා කරන කාර්මික නිෂ්පාදිත ත්‍රිත්වය නිදසුන් සහිතව සඳහන් කරන්න.

(ලකුණු 2)

(ආ) මෙම සමාගම පදනම් කර ගෙන අලෙවිකරණ මිශ්‍රය පාරිභෝගික දෘෂ්ටියෙන් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 2)

v. (අ) ඔබ සිතන පරිදි මෙම සමාගමට අදාල හා යෝග්‍ය නිෂ්පාදන ක්‍රම, කම්හල් පිරියත ක්‍රම, තොග පාලන ක්‍රම හා මිල කිරීමේ ක්‍රමය වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) කෙටි සටහන් ලියන්න.

1) ප්‍රතිපත්ති (ලකුණු ½)
2) උපාය මාර්ග (ලකුණු ½)
3) ක්‍රියාමාර්ග (ලකුණු ½)
4) නීති රීති (ලකුණු ½)

(මුළු ලකුණු 20)

7.

i. සිසිර විජේනායක මහතා වසර 15 කට ආසන්න කාලයක් විදේශ රටක රැකියාවක නිරතව සිට ශ්‍රී ලංකාවට පැමිණ ඔහු උපයාගෙන ඇති රු. 5,000,000 ක මුදල කොළඹ කොටස් හුවමාරුවේ ආයෝජනය කිරීමට බලාපොරොත්තුවෙන් සිටී.

(අ) කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම්පත් වර්ග හතරක් නම් කරන්න.

(ලකුණු 2)

(ආ) කොළඹ කොටස් හුවමාරුවේසුරැකුම්පත් වල ආයෝජනයෙන් ලැබෙන සෘජු හා වක්‍ර ප්‍රතිලාභ දෙක බැගින් ලියන්න. (ලකුණු 2)

ii. (අ) සීමිත පොදු සමාගමකට කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි විය හැකි ආකාර දක්වන්න. (ලකුණු 2)

(ආ) S&P ශ්‍රී ලංකා 20 දර්ශකය (S&P SL 20 INDEX) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 2)

iii. සී / ස මැක්සිටි (පෞද්) සමාගමේ A හා B ලෙස නිෂ්පාදන අංශ දෙකක් සමන්විත ය. පිළිවෙලින් එම අංශ වල සේවකයන් 120 දෙනෙක් හා 80 දෙනෙක් සේවයේ නිරත ව සිටී. ලබන වසරේ අංශ දෙකේ ම නිෂ්පාදනය 50% ක් වැඩි කිරීමට ද, A අංශයේ සේවකයන් හතර දෙනෙකු ද B අංශයේ සේවකයන් හය දෙනෙකු ද විශ්‍රාම යාමට නියමිත ය. එසේම මෙම අංශ දෙක සඳහා සේවකයන් පිටතින් 50% ක් බඳවා ගැනීමට ද නියමිත ය.

(අ) මානව සම්පත් ඉල්ලුම පුරෝකථනය කිරීමේ දී අවධානය යොමු කල යුතු සාධක 4ක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාරයකට මානව සම්පත් කළමනාකරණය අවශ්‍ය වන්නේ ඇයි දැයි දක්වා ඒ තුලින් ලබා ගත හැකි වාසි දෙකක් ලියන්න. (ලකුණු 2)

iv. (අ) "අනුස්ථාපනය" ක්‍රියාවලිය හඳුන්වා ඒ සඳහා ව්‍යාපාරයක් යොදා ගනු ලබන ක්‍රම 4ක් නම් කරන්න. (ලකුණු 2)
(ආ) සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමේ ලිපියක් ලැබුණු ඔබ එහිදී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට පෙර සලකා බලන කරුණු 4 ක් සඳහන් කරන්න. (ලකුණු 2)

v. (අ) කාර්ය එල ඇගයීම මගින් සේවයා හා සේවකයාට අත් වන ප්‍රතිලාභ දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) රැකියාස්ථ පුහුණුව ලබා දිය හැකි ආකාර දෙකක් දක්වා, ඒ මගින් සංවිධානයකට ලබාගත හැකි ප්‍රතිලාභ දෙකක් දක්වන්න. (ලකුණු 2)
(මුළු ලකුණු 20)

8.

i. (අ) දත්ත සැකසුම් ක්‍රියාවලියට අයත් කාර්යයන් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) තොරතුරු පද්ධතියක් යනු කුමක් ද ? (ලකුණු 2)

ii. (අ) භාවිතා කරන මට්ටම අනුව තොරතුරු පද්ධති වර්ගීකරණය කරන්න. (ලකුණු 2)
(ආ) ගනුදෙනු සැකසුම් පද්ධතියක් යනු කුමක්ද? එවැනි පද්ධතියකින් නිෂ්පාදන හා අලෙවි අංශ වලට ලබා ගත හැකි ප්‍රයෝජනය බැගින් ලියන්න. (ලකුණු 2)

iii. (අ) තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) ව්‍යාපාර ආයතනයක කාර්ය පහසු කරලීමට අන්තර්ජාලය යොදාගත හැකි අවස්ථා 4 ක් ලියන්න. (ලකුණු 2)

iv. (අ) ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)
(ආ) ව්‍යාපාර සැලැස්ම තුල ඇතුලත් මෙහෙයුම් සැලැස්මක ඇති වැදගත්කම් 2ක් ලියන්න. (ලකුණු 2)

v. (අ) සාමූහික සමාජ වගකීම් සංකල්පය (CSR) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාර සැලැස්මක් තුල ඇතුලත් "විධායක සාරාංශයක" වැදගත්කම් 2ක් ලියන්න. (ලකුණු 2)
(මුළු ලකුණු 20)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

කළුතර අධ්‍යාපන කලාපය - 13 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය
අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2025

ව්‍යාපාර අධ්‍යයනය

I පත්‍රය සඳහා පිළිතුරු (ලකුණු දීමේ පටිපාටිය)

1	4	11	3	21	1
2	3	12	1	22	5
3	3	13	2	23	4
4	1	14	1	24	2
5	5	15	1	25	5
6	2	16	5	26	3
7	4	17	2	27	3
8	2	18	2	28	3
9	5	19	4	29	5
10	3	20	3	30	2

නිවැරදි පිළිතුරකට ලකුණු 2
30 x 2 = 60

* 31 – 50 දක්වා සෑම පිළිතුරකට ලකුණු ½ බැගින් හිමිවේ.

31. (අ) ආර්ථික වර්ධනය / වර්ධනය, සංවර්ධනය
(ආ) වර්තන, ප්‍රාග්ධන

32. (අ) ව්‍යාපාර අවස්ථා / අවස්ථා, අවදානම් කළමනාකරණය
(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව, සි/ස ලංකා ක්ලියර් පෞද්ගලික සමාගම

33. (අ) අක්වෙරළ සමාගම්, ඉහල විදේශ විනිමය / සේවා නියුක්ති අවස්ථා / දියුණු තාක්ෂණය
(ආ) 50% / 51%, මහා භාණ්ඩාගාරය / මුදල් අමාත්‍යාංශය

34. (අ) බහු මාධ්‍ය, වීඩියෝ සම්මන්ත්‍රණ
(ආ) අන්තරාල වෙළෙඳාම, තීරුබදු

35. (අ) ක්‍රියාවලි පිරියත, නිෂ්පාදිත පිරියත
(ආ) තත්ත්ව ආරක්ෂණය, ඵලදායිතාව

36. (අ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය. තොග පවත්වාගෙන
(ආ) සඵලදායිතාවය, කාර්යක්ෂමතාවය

37. (අ) අදහස්, විකුණුම්
(ආ) ආරක්ෂාව, අලෙවිකරණ

38. (අ) ආයෝජනය, ආයෝජන තීරණ
(ආ) තොග පිරිවැටුම් අනුපාතය, අධි තෝලනය

39. (අ) අධිකරණ, පොලිස්, බන්ධනාගාර, සන්නද්ධ හමුදාවේ
(ආ) දිරිදීමනා, ක්‍රියාත්මක කිරීම

40. (අ) අදහසක්, ව්‍යාපාර සැලැස්මක්
(ආ) මිලියන 21.9 හෝ මිලියන 22, වර්ධන අනුපාතය - 0.5 හෝ - 0.6

41. 1. තරඟකාරිත්වයට මුහුණ දීමට පහසුවීම
2. ව්‍යාපාර කටයුතු පුළුල් වීම
3. අඛණ්ඩව වර්ධනය වීම
4. වෙළෙඳපොල කොටස පුළුල් වීම
5. කර්මාන්තය තුල විශිෂ්ඨයින් බවට පත්වීම

42. 1. නිශ්පාදිතයට ආරක්ෂාවක් ලැබීම
2. නිශ්පාදිතය හඳුනා ගැනීමට පහසුවක් ලැබීම
3. නිශ්පාදිතය පිළිබඳ කොරකුරු සැපයීම
4. ආකර්ෂණීය පෙනුමක් ලබාදීම

43. 1. ලැබීම් කඩිනම් කිරීම
2. ගෙවීම් ප්‍රමාද කිරීම
3. වෙළෙඳ ණය ලබා ගැනීම
4. තොග පිරිවැටුම ඉහළ නංවා ගැනීම
5. අත්තිකාරම් ලබා ගැනීම
6. කෙටි කාලීන ණය ලබා ගැනීම
7. ඉදිරිදාතම වෙක් නිකුත් කිරීම
8. අයිරා ලබා ගැනීම
9. ණය සාධ්‍යකරණය

44. 1. විශේෂිත කල්බදු මුල්‍යකරණ සමාගම්
2. ප්‍රාථමික අලෙවිකරුවන්
3. කොටස් තැරැව්කරුවන්
4. ඒකක භාර / ඒකක භාර කළමණාකරන සමාගම්
5. වෙළෙඳ පොල අතර මැදියන්
6. ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්

45. 1. වාචිකව හා ලිඛිතව අවවාද කිරීම
2. පරිවාස කාලය දීර්ඝ කිරීම
3. වෙනත් අංශයකට මාරු කිරීම
4. සේවය අවසන් කිරීම

46. AI : Artificial Intelligence - කෘතිම බුද්ධිය
www : World Wide Web - ලෝක ව්‍යාප්ත ජාල පහසුකම්
GPS : Global Positioning System - ගෝලීය තැන් සෙවුම් පද්ධතිය
WAN : Wide Area Network - ප්‍රාදේශීය ක්ෂේත්‍ර ජාල

47. 1. පිරිවැය අඩුවීම
2. තදබදය අඩුවීම
3. නිරවද්‍යතාව ඉහලවීම
4. කාර්ය මණ්ඩලය අඩුකරගත හැකිවීම
5. බැංකු සේවා පුළුල් වී බැංකුවල ලාභ දායිත්වය වැඩිවීම

48. 1. අධ්‍යාපන ක්ෂේත්‍රයේ - පුද්ගල බද්ධ ඉගෙනුම් යෙදවුම් (App) ….
භාෂා පරිවර්ථන යෙදවුම්
2. සෞඛ්‍ය ක්ෂේත්‍රය - රෝග හඳුනාගැනීම හා ප්‍රතිකාර ක්‍රම තීරණ ...
3. මුල්‍ය ක්ෂේත්‍රය - ආයෝජන කළඹ කළමනාකරණය
4. පාරිභෝගික සේවා - Chatbots …
ආදී වෙනත් දෑ සලකන්න. .....

49. 1. ස්වභාවික සම්පත් බෙදීයාමේ විෂමතාව
2. සාපේක්ෂ පිරිවැය වාසිය
3. සමහර නිශ්පාදිත සම්බන්ධව සමහර රටවල නීතිමය ඒකාධිකාරයක් පැවතීම
4. භාණ්ඩ ප්‍රවර්ධනය
5. වෙළෙඳ බාධක අවම වීම

50. 1. ස්ථාවර වත්කම් අවශ්‍යතා
2. නිශ්පාදිත ධාරිතාව
3. අමුද්‍රව්‍ය අවශ්‍යතා
4. සේවක අවශ්‍යතා
5. නිශ්පාදන පොදු කාර්ය පිරිවැය
6. කර්මාන්ත ශාලා පිරියත සැලැස්ම
7. අපද්‍රව්‍ය බැහැර කිරීම
8. සමාජයීය හා පාරිසරික බලපෑම


කළුතර අධ්‍යාපන කලාපය - 13 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය
අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2025
ව්‍යාපාර අධ්‍යයනය

II පත්‍රය සඳහා පිළිතුරු (ලකුණු දීමේ පටිපාටිය)

---

1) (i) (අ) ප්‍රාථමික - තේ වගාව
ද්විතියික - තේ කර්මාන්ත ශාලාව, තේ නිෂ්පාදනය, කොලජන් ටොෆි
තෘතියික - තේ දේශීය හා විදේශීය වෙළඳපොලට අලෙවි කිරීම
(ල.2)

(ආ)



(ල.2)

(ii) (අ) ශක්තියක් - උපාධිධාරියකු වීම, ඔහු සතු තේ වතු, ඔහුගේ ව්‍යවසායකත්ව හැකියාව

අවස්ථා - වර්තමානයේ තරුණ හා වැඩිහිටි කාන්තාවන් සමේ පැහැය ගැන උනන්දු වීම
(ල.2)

(ආ) ස්වභාවික විපත් අධික වීම, දේශගුණික බලපෑම්, කෘමි උවදුරු, පාරිභෝගික රුචිය වෙනස් වීම, සේවක වැඩ වර්ජන
(ල.2)

(iii) (අ) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම
සම්පත් වලට අගයන් එකතු කිරීම
(ල.2)

(ආ) * අවම කොටස් කරුවන් ගණන 1 ක් හා උපරිම 50 ට සීමා වීම.
* අවම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව එකකි.
* සමාගමේ කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කළ නොහැකි වීම.
* ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයකින් තොරව සියලුම කොටස්කරුවන්ගේ කැමැත්ත මත ලාභාංශ බෙදා හැරිය හැකිවීම.
(වෙන ලක්ෂණ වලට ලකුණු දෙන්න එපා. සුවිශේෂී ලක්ෂණ පමණි)

(ල.2)

(iv) (අ) SLS, HACCP – GHP - හොඳ සනීපාරක්ෂක පිළිවෙත
GMP, ISO 9001 - තත්ත්ව කළමනාකරන පද්ධතිය

(ල.2)

(ආ) ජන ජීවිතයේ යෝග්‍යතාව ප්‍රතිලාභ අරමුණු කරගෙන විද්‍යාව, තාක්ෂණය හා පළපුරුද්දේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස ඒකමතික භාවයෙන් පිළියෙල කොට ඉදිරිපත් කරනු ලබන තාක්ෂණික පිරිවිතරයකි.

(ල.2)

(v) (අ) <u>අවන්තට</u>
- ආත්ම තෘප්තිය
- තම හැකියා මගින් උපරිම ප්‍රයෝජන ගැනීම
- ඉහළ ආදායම් ඉපයීමට හැකිවීම
- සමාජ පිළිගැනීම

<u>සමාජයට</u>
- රැකියා අවස්ථා බිහිවීම
- නව්‍යතා සම්පාදනය
- ජනතාවගේ ජීවන මට්ටම ඉහළයාම
- පුද්ගල ආදායම් ඉහළයාම

(ල.2)

(ආ) * ආදායම් උපයමින් ණය වාරික ගෙවිය හැකි වීම
* පොළිය සාපේක්ෂව අඩුවීම
* විශාල මුදලක් ලබාගත හැකිවීම
* ආපසු ගෙවන කාලය පිළිබඳ එකඟතාවයට පැමිණිය හැකිවීම

(ල.2)

2) (i) (අ) පරිසර තිරසර ආරක්ෂණය
මූලික මිනිස් අවශ්‍යතා වන වාතය, ජලය, ආහාර, නිවාස යනාදිය ගුණාත්මකභාවයෙන් පැවතීම හා ඒවා ආරක්ෂා කර ගනිමින් පවත්වාගෙන යාම මගින් මූලික මිනිස් අවශ්‍යතා සපුරාලීම පරිසර තිරසර ආරක්ෂණයෙන් අපේක්ෂා කෙරේ. (ල.2)

(ආ) පරිසර හිතකාමී නිෂ්පාදිත බිහිකිරීම
පරිසර හිතකාමී බලශක්ති භාවිත කිරීම (ල.2)

(ii) (අ) රැකියා නිර්මාණය, සම්පත් කාර්යක්ෂම භාවිතය, ප්‍රාග්ධනය කාර්යක්ෂම භාවිතය, අවදානම් කළමනාකරණය, ආර්ථික වර්ධනය බලගැන්වීම, නවෝත්පාදන හඳුන්වා දීම, තාක්ෂණයේ දියුණුව, ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනයට දායක වීම. (ල.2)

(ආ) නැවත භාවිතය (Reuse)
ඉවත ලන රෙදි හා ප්ලාස්ටික් නැවත භාවිත කළ හැකි ලෙස සැකසීම (ල.2)

(iii) (අ) ව්‍යාපාර සමාජ වගකීම් ඉටුකිරීමේ දී ව්‍යාපාර නාම, සන්නම හෝ වෙළඳ ලකුණු මුල්කරගෙන එම කාර්ය සිදුකිරීමේ දී එය සැඟවුණු ප්‍රචාරණයකි.
උදා:- ගංවතුර, නායයෑම්වලදී මාධ්‍ය ආයතන අනුග්‍රහ දැක්වීම (ල.2)

(ආ) * පිරිවැය අධික වීම
* ආචාරධර්ම පිළිබඳව නොදැනුවත්භාවය
* සේවකයන්ට ආචාරධර්ම පිළිබඳ පුහුණු කිරීම දුෂ්කර වීම
* මිනිස් ආකල්ප වල ඇති බලපෑම් (ල.2)

(iv) (අ) පාරිභෝගිකයා ගෙවන මුදලට ප්‍රමාණවත් තෘප්තියක් ලබාදීම සහතික කිරීම පිණිස සලසා ඇති නීතිමය ආවරණය

(ල.1)

<u>පාරිභෝගිකයාට</u>

- ගෙවන මිලට සරිලන භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව ලැබීම
- වෙළෙඳ විෂමාචාර වලින් වැලකීම
- පාරිභෝගික සෞඛ්‍ය ආරක්ෂා වීම
- පාරිභෝගිකයාට ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය වීම

(ල.1)

(ආ) <u>වාසි</u>

- දේශීය කර්මාන්ත ආරක්ෂා වීම
- දේශීය කර්මාන්ත වලට තරඟ කිරීමේ හැකියාව ඉහළ යාම
- දේශීය නිෂ්පාදිත සඳහා ඉල්ලුම ඉහළයාම

(ල.1)

<u>අවාසි</u>

- ඇතැම් අමුද්‍රව්‍ය වල මිල ඉහළයාම නිසා පිරිවැය ඉහළයාම
- විකුණුම් පිරිවැටුම පහළ යාම

(ල.1)

(v) (අ) කේවල ස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම් (ල.2)

(ආ)

වරලත් ව්‍යාපාර	ව්‍යාපාර සංයෝජන
• කිසියම් වෙළඳනාමයක් භාවිතා කරමින් ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම සඳහා වරලත් හිමියකු හා වරලත් ලාභියෙකු අතර ඇති කරගන්නා වූ සම්බන්ධතාවය.	• සමාගම් දෙකක් හෝ කිහිපයක් එකට එකතු වී කටයුතු කරයි.
• නිෂ්පාදිත, නිෂ්පාදන, ව්‍යාපාර ක්‍රමය ලෙස වරලත් ව්‍යාපාර ඇරඹිය හැක.	• ඒකාබද්ධ වීම හෝ අත්පත් කරගැනීම ලෙස සිදුවේ.
• වරලත් හිමියාට පුරස්කාර ලැබේ.	• කොටස් හිමියන්ට ලාභාංශ හිමි වේ.
• දෙපාර්ශ්වයකට අයිති ව්‍යාපාර දෙකක් ගිවිසුමක් මත කටයුතු කරයි.	• තනි ඒකකයක් හෝ පරිපාලන සමාගමක් ලෙස ක්‍රියාකරයි.

(වෙනස්කම් 2 ට ල. 2)

3) (i) (අ) දේශීය කර්මාන්තකරුවන්ට
- තම නිෂ්පාදිත සඳහා හොඳ මිලක් ලැබීම
- තම නිෂ්පාදිත සඳහා වෙළෙඳ පොල ආරක්ෂා වීම (ල.2)

රජයට
- බදු ආදායම ඉහළයාම
- විදේශ විනිමය ඉතිරිවීම (ල.2)

(ආ) 1. ආනයන බද්ද
2. ආනයන සෙස් බද්ද
3. ජාතිය ගොඩගැනීමේ බද්ද
4. එකතු කල අගය මත බද්ද
5. වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද (ල.2)


(ii) (අ) 1. වෙළෙඳපොල ඒකාධිකාරය වැලැක්වීම
2. පෞද්ගලික අංශයේ අහිතකර ලාභ ඉපයීම වැලැක්වීම
3. සාධාරණ මිලට අත්‍යවශ්‍ය සේවා සැපයීමට
4. සම්පත් නාස්තිය අවම කිරීමට
5. ලාභ නොමැති පෞද්ගලික අංශය අත නොගසන අංශ පවත්වාගෙන යාමට.
6. ජාතියේ ආරක්ෂාව වෙනුවෙන් පවතින යම් යම් ව්‍යාපාර ක්ෂේත්‍ර පවත්වා ගැනීමට (ල.2)

(ආ) 1. ග්‍රාමීය ප්‍රදේශ වල ආර්ථික තත්වය පුළුල් කිරීම
2. ප්‍රාදේශීය සම්පත් භාවිතයට එම ප්‍රදේශවල ප්‍රජාවන් බලගැන්වීම
3. ග්‍රාමීය ප්‍රදේශ වලින් අපනයන අවස්ථා ප්‍රවර්ධනය
4. කර්මාන්ත අමාත්‍යාංශය, කර්මාන්ත හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය ලෙස ප්‍රතිව්‍යුහගත කිරීම
5. දේශීය කර්මාන්තවල ඵලදායීතාව ඉහල නංවා ගැනීමට ආයතනික සහයෝගය ලබාදීම (ල.2)

(iii) (අ) මූල්‍ය සාක්ෂරතාවය යනු බුද්ධිමත් ආකාරයකින් මුදල් කළමණාකරනය කරන්නේ කෙසේ දැයි දැන ගැනීමයි. එය අපගේ දෛනික ජීවිතයේ අපට අවශ්‍ය මූලික දේවල් වන මුදල් උපයන්නේ කෙසේද, වියදම් කරන්නේ කෙසේද, ඉතිරි කරන්නේ කෙසේද, ණයට ගන්නේ කෙසේද සහ ආයෝජනය කරන්නේ කෙසේද යන්න තේරුම් ගැනීමයි. (ල.2)

(ආ) මූල්‍ය සාක්ෂරතාවය මත සිට මනාව මුදල් පරිහරණය කොට තම අතිරික්ත අරමුදල් හා ණය අරමුදල් මගින් නව්‍යතා සම්පාදනයට මග පාදාගැනීමයි. ඒ තුලින් ව්‍යාපාර කටයුතු ආරම්භ කොට පවත්වා ගැනීම. (ල.2)

(iv) (අ)



(ආ) චෙක් අංකය
බැංකු අංකය
බැංකු ශාඛා අංකය (ල.2)
ගිණුම් අංකය (ල.2)

(v) (අ) 1. ආදායකයා විසින් චෙක්පත බැංකුවේ තැන්පත් කිරීමේදී.
2. විධාන චෙක්පතක් අන් අයෙකුට පැවරීමේදී.
3. රේඛණය නොකල චෙක්පතක් සඳහා බැංකු කවුන්ටරයෙන් මුදල් ලබාගැනීමේදී. (ල.2)

.

(ආ) 1. එකම භාෂාවකින් පිටසන් කිරීම
2. ගරුනාම තනතුරු නොයෙදීම
3. චෙක්පතෙහි ආදායකයාගේ නම මුලකුරු නැතිව ලියුවද පිටසනෙහි මුලකුරු ඇතුලත්වීම
4. ඉංග්‍රීසියෙන් පිටසන් කරන්නේ නම් වැල් අකුරෙන් පිටසන් කිරීම
5. ආදායකයාගේ නමෙහි අක්ෂර වින්‍යාසය වැරදිනම් ඒ ආකාරයටම පිටසන් කිරීම
6. මියගිය අයෙකු වෙනුවෙන් ලද චෙක්පත පොල්මංකරුවට පිටසන් කලහැකි වීම (ල.2)

4) (i) (අ) 1. අවදානම පුරෝකථනය කල හැකි වීම
2. අවදානම මුල්‍යමය වශයෙන් තක්සේරු කල හැකි වීම.
3. අවදානම නියත නොවීම
4. සම්බන්ධතා වලින් තොර වීම
5. සත්‍යාපනය කලහැකි වීම (ල.2)

(ආ) 1. අවදානම් ආවරණය කරන බැවින් ව්‍යාපාර ආරම්භ කිරීමට ආයෝජකයන් පෙළඹීම
2. ආබාධිත තත්වයකදී හෝ මරණයකදී මුල්‍යමය ආරක්ෂණ ලැබීම (සේවකයන්ට)
3. රක්ෂණ සමාගම් තමා සතු අරමුදල් නැවත ආයෝජනය කිරීමෙන් රටේ සංවර්ධනය ඇතිවීම (ල.2)

(ii) (අ) 1. වෙන්දේසි 2. ටෙන්ඩර් (ල.2)

(ආ) 1. මංතීරු නීතිය වඩා ඵලදායි ලෙස නැවත ක්‍රියාත්මක කිරීම
2 කඩවත, මාකුඹුර, කටුබැද්ද බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ආශ්‍රිතව Park and ride සේවා ආරම්භ කිරීම
3. පාපැදි භාවිතය ප්‍රචලිත කිරීම
4. පාපැදි ධාවනයට සමාන්තර මංතීරු හඳුන්වාදීම
5. නව කාර්යාලීය දුම්රිය ඇතුළු නව දුම්රිය ගමන් වාර ආරම්භ කිරීම
6. පානදුර, රාගම ඇතුළු හඳුනාගත් දුම්රිය ස්ථාන ආශ්‍රිතව Park and ride සේවාව ආරම්භ කිරීම
7. සිසු සැරිය සහ ග්‍රාමීය සේවා සඳහා නව බස්රථ ලබාදීම (ල.2)

(iii) (අ) යවන්නා ⟶ අගමැතිතුමිය / අධ්‍යාපන ඇමතිතුමිය
පණිවිඩය ⟶ විෂයමාලා සංශෝධනය
මාධ්‍ය ⟶ වාචික
ලබන්නා ⟶ පාර්ලිමේන්තුවේ සිටින සාමාජිකයින් (ල.2)

(ආ) හැන්සාඩ් වාර්තාව (ල.2)

(iv) (අ) නිර්මාණශීලී පිළිතුරක් සඳහා ලකුණු 2ක් ලබාදෙන්න. (ල.2)

(ආ) 1. නිෂ්පාදිත අඛණ්ඩව වෙළෙඳපොලට ඉදිරිපත් කිරීම
2. නාස්තිය අපතය අවම කර කාර්යය සැලසුම් සහගතව ඉදිරිපත් කිරීමට
3. තරඟකාරිත්වයට ශක්තිමත්ව මුහුණදීමට
4. අක්‍රීය පිරිවැය අවම කිරීම
5. අපද්‍රව්‍ය නිසි පරිදි කළමණාකරනයට (ල.2)

(v) (අ) රටවල් කිහිපයක් විසින් බදු, තීරු ගාස්තු සහ වෙළඳාම පිළිබඳව ගිවිසුමකට එළඹී නිදහස් වෙළඳ ප්‍රදේශයක් වෙළඳ කලාපයක් ලෙස හඳුන්වයි. (ල.2)

(ආ) තායිලන්තය, ඉන්දුනීසියාව, මියන්මාරය, පිලිපීනය, සිංගප්පූරුව, මැලේසියාව, වියට්නාමය, ලාඕසය, Brunei, Cambodia, Timor (ල.2)

5) (i) (අ) යෙදවුම් හා නිමැවුම් අතර අනුපාතික සම්බන්ධතාවයයි. (ල.½)

5 ‘ S

1. සෙයිරි (සංවිධිත බව) - අනවශ්‍ය දේ ඉවත් කිරීම
2. සෙයිතෝන් (සුපිළිවෙල) - අවශ්‍ය දේ විධිමත්ව ඇසිරීම
3. සෙයිසෝ (සුපිරිසිදුකම) - පිරිසිදු කිරීම
4. සෙයිකෙත්සු (සම්මුතිය) - ක්‍රමානුකූල බව
5. සෙත්සුකේ (ශික්ෂණය) - විනයානුකූල බව (ල. 2½)

(ආ) සමස්ත සංවිධානයටම මගපෙන්වන මුළු ආයතනයේම කාර්යභාරය සම්පිණ්ඩනය කරන ප්‍රකාශයයි. (ල.½)

සමාජයට විශ්ව දැනුමකින් යුතු බුද්ධිමතුන් දායාද කිරීම. (ල.½)

(ii) (අ) * ඒකාධිපති - ඇතැම් විට තමාගේ තීරණය මතම කටයුතු කරන අවස්ථා පැවතීම. (ල.1)

* ප්‍රජාතන්ත්‍රවාදී - අන් අයගේ අදහස් උදහස් වලට ගරු කරමින් තීරණ ගැනීම. (ල.1)

(ආ) * නායකත්වයයි. (ල.½)

* <u>ගුණාංග</u>
ප්‍රියජනක බව
උසස් පෞරුෂත්ව ලක්ෂණ
බුද්ධිමත් බව
ආත්ම විශ්වාසය
නිරෝගී බව.
ස්වයං විනය
අධිෂ්ඨානය
කැපවීම

(ල.1½)

(iii) (අ) * ඉදිරියේ දී ඇතිවිය හැකි අහිතකර තත්වයන්ගෙන් ආයතනයේ කාර්ය සාධනයට විය හැකි හානිය අවම කරගැනීමට සිදු කරන පාලනයයි. (ල.½)

උදා:- සේවාස්ථ සැසි, පුහුණු වැඩසටහන් (ල.½)

* සංවිධානයේ මෙහෙයුම් කටයුතු සිදුවෙමින් තිබියදී විය හැකි විචලනයන් වළක්වා ගැනීමට ගන්නා ක්‍රියාමාර්ගයි. (ල.½)

උදා:- අභ්‍යන්තර විගණනය, ජ්‍යෙෂ්ඨ ගුරුවරු කණිෂ්ඨ ගුරුවරු අධීක්ෂණය (ල.½)

(ආ) 1. * බලතල සමඟ පැවරෙන කාර්ය කිරීමට ඇති බැඳීම වගකීම වේ. එය ඉහළ සිට පහළට ගලා එනු ලැබේ. (ල.½)

* කාර්ය ඵලවල සාර්ථක අසාර්ථක බව පිළිබඳ හේතු ඉදිරිපත් කිරීම වගවීමයි. එය පහළ සිට ඉහළට ගලා යනු ලැබේ. (ල.½)

2. ඉලක්ක ලඟා කරගැනීමට අනුගාමිකයින් අභිප්‍රේරණය කරන්නා නායකයා වේ. (ල.½)

ඉලක්ක ලඟා කරගැනීමට නිවැරදි දේ නිවැරදිව කරන්නා කළමනාකරු වේ. මෙය බොහෝ විට පත් කල හැකිය. (ල.½)

(iv) (අ) * රෝහල ඉදිකිරීමේ දී - ස්ථාවර ස්ථානීය පිරියත (ල.½)

අවශ්‍ය සියලුම යෙදවුම් අදාල ස්ථානයට ගෙනැවිත් නිෂ්පාදනය සිදු කිරීම සඳහා පිළියෙල කරන පිරියතයි. (ල.½)

* සෞඛ්‍ය සේවය සැපයීම - ක්‍රියාවලි පිරියත (ල.½)

නිෂ්පාදන ක්‍රියාවලියේ එක් අදියරක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය සියලු දේ එක් ස්ථානයක සිදුවන පරිදි ඊට උචිත යෙදවුම් රැස් කරමින් පිළියෙල කරන පිරියතයි. (ල.½)

(ආ) 1. තොග පිරිවිතර / ප්‍රමිති
තොගවල ගුණාත්මක බව / තත්ත්වය
මිල
වේගවත් බව
අඛණ්ඩ බව
විශ්වාසවන්ත භාවය
පොරොත්තු කාලය
ගෙවීම් කොන්දේසි (ල.1)

2. A - ආර්ථික ඇණවුම් ප්‍රමාණය භාවිතය

හෝ

පරිගණක වැඩ සටහන් භාවිතය (ල.½)

C - ද්විත්ව භාජන ක්‍රමය

හෝ

අඛණ්ඩ තොග වාර්තා තබා ගැනීමේ ක්‍රමය (ල.½)

(v) (අ) මහා ක්‍රියාකාරිත්වය, කල්පැවැත්ම, විශ්වාසවන්ත බව, ප්‍රමිතියට අනුකූල බව, උචිත බව, ආරක්ෂිත බව. (ල.2)

(ආ) * නිෂ්පාදන ක්‍රියාවලිය අඩපණ වීම
* හදිසි ඇණවුම් සපුරාලිය නොහැකි වීම
* යන්ත්‍ර නිසි පරිදි ක්‍රියාත්මක නොවීමෙන් ඇතිවන අක්‍රීය පිරිවැය
* සේවකයින්ගේ උපරිම සේවය අහිමි වීමෙන් නිරර්ථක කාලය ඉහළ යාම
* ව්‍යාපාරයට ඇණවුම් නොලැබී යාම. (ල.2)

6) (i) (අ) * ගනුදෙනුකරු / අලෙවිකරණය සංකල්පය (ල.½)

* ගනුදෙනුකරුවන් වෙන් වෙන්ව ගෙන ඔවුන්ට ගැලපෙන පරිදි නිෂ්පාදිතත්, අලෙවි උපාය මාර්ගත් අනුගමනය කරමින් ගනුදෙනුකරුට දිගු කාලීන වටිනාකමක් ලබා දීම මින් අපේක්ෂා කෙරේ. (ල.1½)

(ආ) 1. * නොහැකිය (ල.1)
හේතුව, සන්නම වෙළඳ ලකුණක් ලෙස ලියාපදිංචි කර තිබෙන බව
® සංකේතයෙන් අදහස් වේ. (ල.½)

2. * පෞද්ගලික සන්නම
* පවුල් සන්නම
* ජාතික සන්නම
* භාණ්ඩ සන්නම
(ලකුණු ½)

මෙම සමාගමේ සන්නම ජාතික සන්නමක් වේ. (ල.½)

(ii) (අ) * භූගෝලීය පදනම - ලොව පුරා රටවල් පදනම් කරගැනීම
* ප්‍රජාවිද්‍යාත්මක පදනම - ගනුදෙනුකරුවන්ගේ වෘත්තිය
* මනෝවිද්‍යාත්මක පදනම - සමාජ පන්තිය
* චර්යාත්මක සාධක - භාවිත කරන්නන්ගේ ආකල්ප

(ල.2)

(ආ) පළල 04 කි. (ල.½)
කලිසම්, පාවහන්, හිස්වැසුම්, ගමන්මලු (ල.½)

(iii) (අ) සාධක
* භාණ්ඩයේ ස්වභාවය
* ඉල්ලුමේ ස්වභාවය
* වෙළඳපොලේ ස්වභාවය
* තරඟකාරිත්වයේ ස්වභාවය
* නිෂ්පාදකයාගේ ශක්තිය
(ල.1)

වක්‍ර බෙදාහැරීමේ මාර්ග
1. ඒකීය මාර්ගය
2. ද්විත්ව මාර්ගය
3. ත්‍රිත්ව මාර්ගය
(ල.1)

(ආ) * නිෂ්පාදිත පිළිබඳ ඇල්මැති පාර්ශ්වයන්ට සන්නිවේදනය තුලින් ඔවුන් ඒවා මිලදී ගැනීමට උනන්දු කරවීම ප්‍රවර්ධනයයි. (ල.½)

* ප්‍රවර්ධන ක්‍රම -
1. ප්‍රචාරණය
2. විකුණුම් ප්‍රවර්ධනය
3. පෞද්ගලික අලෙවිය
4. මහජන සම්බන්ධතා
5. සෘජු අලෙවිකරණය
6. ඉසව් හා අත්දැකීම්
(ල.1)

* සෘජු අලෙවිකරණ ක්‍රම -
1. සෘජු තැපෑල
2. කැටලොග් මගින් අලෙවිය
3. වෙබ් අඩවි මගින් අලෙවිය
4. දුරකථන මගින් අලෙවිය
5. විද්‍යුත් අලෙවිකරණය
(ල.½)

(iv) (අ) සාප්පු භාණ්ඩ (ල.½)
කාර්මික නිෂ්පාදිත -
1. ද්‍රව්‍ය හා කොටස්
උදා:- රෙදි, නූල්, බොත්තම්
(ල.½)

2. ප්‍රාග්ධන ආයිතම
උදා:- මහන යන්ත්‍ර, කපන යන්ත්‍ර, මදින යන්ත්‍ර, ගොඩනැගිලි
(ල.½)

3. සැපයුම් හා ව්‍යාපාර සේවා
උදා:- ලිපිද්‍රව්‍ය, පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය, මුල්‍ය සේවා (ල.½)

(ආ) S - පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා (C)
උදා:- ඇඳුම් පැලඳුම් අවශ්‍යතාව ඉටු කිරීම (ල.½)

I - සන්නිවේදනය (C)
උදා:- සෘජු අලෙවිකරණ උපාය මාර්ග භාවිතයෙන් මිලදී ගැනීමට උද්දීපනය (ල.½)

V - පිරිවැය (C)
උදා:- ඉහළ මිලක් අලෙවි කිරීම (ල.½)

A - පහසුව (C)
උදා:- අතරමැදියන්ගෙන් තොරව සමාගමෙන්ම සෘජුව මිලදී ගැනීමට හැකිවීම (ල.½)

(v) (අ) නිෂ්පාදන ක්‍රම - කාර්යය / ප්‍රවාහ (ල.½)
පිරියත ක්‍රමය - කුටි (ල.½)
තොග පාලන ක්‍රමය - JIT (ල.½)
මිල කිරීමේ ක්‍රමය - සංජානනීය වටිනාකම මත මිල ක්‍රමය (ල.½)

(ආ)

1. පූර්ව ස්ථාපිත පරමාර්ථ ඉටු කර ගැනීමට මඟ පෙන්වන දර්ශකයයි.
උදා:- * අභ්‍යන්තර බඳවා ගැනීමේ ප්‍රතිපත්තියයි.
* වෙනත් ගැලපෙන නිදසුන් (ල.½)

2. පරමාර්ථ ළඟා කර ගැනීමට කළ යුත්තේ කුමක්ද යන්නයි.
උදා:- * උචිත හා ආකර්ෂණීය ප්‍රචාරණ දැන්වීමක් සැකසීම
* වෙනත් ගැලපෙන නිදසුන් (ල.½)

3. පරමාර්ථ උදෙසා කළ යුතු කාර්යයන් කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර සමූහයයි.
උදා:- * සේවකයන් බඳවා ගැනීමේ පියවර
* වෙනත් ගැලපෙන නිදසුන් (ල.½)

4. කිසියම් කාර්යයක් ඉටු කිරීමේ දී කළයුතු හා නොකළ යුතු දේ විස්තර කෙරෙන දර්ශකයයි.
   උදා:- * පත්වීම් ලිපිය ලබාදීමේ දී රැකියා ගිවිසුමට අත්සන් කිරීම
   * පෙරවරු 8.15 ට පෙර රැකියා ස්ථානයට පැමිණීම
   * වෙනත් ගැලපෙන නිදසුන් (ල.½)

7) I (අ) i. සාමාන්‍ය කොටස්
ii. වරණීය කොටස්
iii. කොටස් බලපත්‍ර
iv. සාංගමික ණයකර
v. රජයේ සුරැකුම්පත්

(ල. 2)

(ආ) <u>සෘජු ප්‍රතිලාභ</u>
i. ලාභාංශ ලැබීම (කොටස්)
ii. පොලී ලැබීම (සාංගමික ණයකර)
iii. සංචිත ප්‍රාග්ධනීකරණය
iv. හිමිකම් නිකුතුව
v. ප්‍රාග්ධන ලාභ ලැබීම (ල.1)

<u>වක්‍ර ප්‍රතිලාභ</u>
i. සාමාන්‍ය කොටස් හිමියන්ට ඡන්ද බලය හිමිවීම හා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්විය හැකි බව.
ii. රජයේ සුරැකුම්පත් මිලදී ගත් පුද්ගලයන්ට එය ලබා ගැනීමේ දී ඇප සුරැකුම්පත් ලෙස භාවිත කල හැකි බව.
iii. රජයේ සුරැකුම්පත් වල කරන ආයෝජනයේ අවධානම ඉතා අඩු මට්ටමක පැවතීම හා ඉහළ ද්‍රවශීලතාවන් පැවතීම.
iv. කොටස් විකිණීමෙන් හිමිවන ප්‍රාග්ධන ලාභ බදුවලින් නිදහස් වීම.
v. කොටස් අවශ්‍ය විටෙක වෙළඳපොලේ විකිණීමට හැකිවීම නිසා ඉක්මනින් මුදල් බවට පත්කර ගත හැකි වීම.
vi. ප්‍රසාද නිකුතුව වලට හිමිකම ලැබීම. (ල.1)

II. (අ) i. මූලික ප්‍රසිද්ධ නිකුතුවක් මගින්
ii. විකුණුම් අර්පනයක් මගින්
iii. හඳුන්වා දීමක් මගින්

(ල. 2)

(ආ) කොළඹ ව්‍යාපාර වස්තු භුවමාරුවේ විශාලතම වඩාත් ද්‍රවශීල සමාගම් 20 ක මිල ගණන් වල වෙනස් වීම මැනීම සඳහා ගණනය කරනු ලබන දර්ශකය S & P 20 මිල දර්ශකය වේ. (ල.1)

* වෙළඳපොල ප්‍රාග්ධනීකරනය, ද්‍රවශීලතාවය, මුල්‍ය ශක්‍යතාව යන සාධක අනුව ඉහත සමාගම් 20 තෝරා ගනී.

S & P ශ්‍රී ලංකා 20 මිල දර්ශකය = තෝරාගත් සමාගම් 20 හි වර්තමාන ප්‍රාග්ධනීකරණය / තෝරාගත් සමාගම් 20 හි පාදක දිනයේ වෙළඳපොල ප්‍රාග්ධනීකරණය X 100

(ල.1)

III. (අ) i. භාණ්ඩය හෝ සේවාව සඳහා වූ ඉල්ලුම
ii. ආයතනයේ පරමාර්ථ
iii. නිෂ්පාදන ක්‍රමය
iv. අනාගත විශ්‍රාම යාම්, ඉල්ලා අස්වීම්, උසස් වීම්, ඉවත් කිරීම්. සේවා නියුක්තිය අවසන් කිරීම
v. ආයතනයේ වර්තමාන හා අනාගත තත්වය
vi. ආර්ථික, සාමාජීය, දේශපාලන හා නෛතික පරිසරය

(ල.2)

(ආ) සේවක අවශ්‍යතා නිශ්චය කර, එම අවශ්‍යතා ඉටු කර ගැනීම පිණිස අවශ්‍ය උපාය මාර්ග තීරණය කිරීම තුලින් මානව සම්පත මනාව කළමනාකරණය කළ හැකි වීම.

(මෙම අදහස් ඇතුළත් පිළිතුරකට - ල.1)

<u>වාසි</u>

i. අනාගත සේවක අවශ්‍යතා නිශ්චය කළහැකි වීම
ii. අනාගත ශ්‍රම ඌනතා හා අතිරික්ත හඳුනාගෙන ඒවාට නිසි ක්‍රියාමර්ග ගැනීමෙන් සේවක පිරිවැය අඩුකර ගත හැකි වීම
iii. හදිසි බදවා ගැනීම් නිසා සිදුවිය හැකි අනවශ්‍ය පිරිවැය වලක්වා ගතහැකි වීම
iv. සේවක සංවර්ධනය හඳුනාගත හැකිවීම
v. ආයතනයේ අනෙකුත් කළමනාකරණ කාර්ය අපේක්ෂිත පරිදි මෙහෙය විය හැකි වීම. (ල.1)

IV. (අ) අලුතෙන් හඳුන්වා දුන් සේවා දායකයෙකු ප්‍රථමයෙන් සංවිධානයකට හඳුන්වා දීම හා ඔහුට / ඇයට සිය රැකියාව, වැඩ කණ්ඩායම්, වැඩ පරිසරය, සමස්ත සංවිධානය පිළිබඳ අවබෝධයක් ලබාදීමේ කාර්යය අනුස්ථාපනයයි.

(ල.1)

i. සේවාදායක අත්පොත්
ii. තොරතුරු පත්‍රිකා
iii. පැරණි සේවකයන් යොදා ගැනීම
iv. වීඩියෝ
v. චිත්‍රපටි
vi. ආයතනය තුල වාර්තා
vii. දේශන

(ල.1)

(ආ) i. ආයතනය පිළිබඳ විස්තර අධ්‍යයනය කිරීම
(වෙබ් අඩවි තුලින්ඇතුළු වෙනත් ක්‍රියාමාර්ග)
ii. සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළයුතු අවශ්‍ය ලියවිලි සකස් කර ගැනීම
iii. පෞරුෂය පරීක්ෂණයක් පවත්වන්නේ නම් ඒ පිළිබඳව සැලකිලිමත් වීම
iv. සම්මුඛ පරීක්ෂණය සඳහා අඳින ඇඳුම පිළිබඳව සැලකිලිමත් වීම ආදී ඕනෑම පිළිතුරක්

(ල. 2)

V. (අ) <u>සේව්‍යයාට</u>
i. පුහුණුකිරීමේ අවශ්‍යතා හඳුනාගත හැකි වීම
ii. උසස් කිරීම් හා මාරු කිරීම් පිළිබඳ තීරණ ගතහැකි වීම
iii. සංවේතන තීරණය ගත හැකි වීම
iv. සේවක සඵලදායිතාව වැඩි වීම

(ල.1)

<u>සේවකයාට</u>
i. අභිප්‍රේරණය ඇතිවීම
ii. ඇගයීමෙන් ලැබෙන ප්‍රතිලාභ ලැබිය හැකි විම
iii. අනාගත උසස් වීම් සඳහා සුදුසුකම් ලැබීමට හැකි වීම
iv. ඉපැයීම් ඉහළ නංවා ගැනීමට හැකි වීම
v. දුර්වලතා / හැකියා හඳුනාගත හැකි වීම

(ල.1)

(ආ) <u>ආකාර</u>
i. පුහුණු කිරීම
ii. ආධුනිකත්ව පුහුණුව
iii. රැකියාවන් අතර පුහුණුව / රැකියා භ්‍රමණය
iv. සීමාවාසික පුහුණුව
v. ප්‍රධානියෙකු යටතේ පුහුණුව
vi. උපදේශනය
vii. සමාකරණ පුහුණුව

(ල.1)

<u>ප්‍රතිලාභ</u>
i. රැකියාවේ නියැලෙමින් පුහුණුවන නිසා නිෂ්පාදනයට බාධා නොවීම
ii. පුහුණු පිරිවැය අවම වීම
iii. පුහුණුව වඩාත් ඵලදායි වීම
iv. සේවක අභිප්‍රේරණය වර්ධනය වීම

(ල.1)

8) I (අ)

1. වර්ගීකරණය
2. තේරීම
3. ගණනය කිරීම
4. සාරාංශකරණය (ල.2)

(ආ) ව්‍යාපාරයක තීරණ ගැනීම හා පාලනය සඳහා අවශ්‍ය වන තොරතුරු රැස්කිරීම, සැකසීම, ගබඩා කිරීම හා බෙදාහැරීම සඳහා වූ අන්තර් සම්බන්ධතාවයකින් යුත් උපාංග සමූහයක එකතුවක් තොරතුරු පද්ධතියක් ලෙස හැඳින්වේ. (ල.2)

II (අ)

1. උපක්‍රමික මට්ටමේ තොරතුරු පද්ධති
2. කළමණාකරන මට්ටමේ තොරතුරු පද්ධති
3. දැනුම් මට්ටමේ තොරතුරු පද්ධති
4. මෙහෙයුම් මට්ටමේ තොරතුරු පද්ධති (ල.2)

(ආ) සංවිධානයක දෛනික මෙහෙයුම් කටයුතු වලින් බිහිවන දත්ත සැකසීමට භාජනය කරන තොරතුරු පද්ධති ගනුදෙනු සැකසුම් පද්ධති ලෙස හැඳින්වේ. (ල.1)

නිෂ්පාදන අංශය - ද්‍රව්‍ය මිලට ගැනීමට
දුව්‍ය ඇනවුම් කිරීමට (ල.½)

අලෙවි අංශය - විකුණුම් ඇනවුම් ලබාගැනීමට
මිල කිරීමට (ල.½)

III (අ) වේගවත් බව, නම්‍යශීලිබව, විශ්වාසවන්ත භාවය, ගුණාත්මකභාවය වර්ධනය, වැඩි තොරතුරු ප්‍රමාණයක් කළමනාකරණය කිරීම, අඩු සේවක සංඛ්‍යාවක් ප්‍රමාණවත් වීම, අඩු ඉඩක් ප්‍රමාණවත් වීම, පිරිවැය අඩුවීම. (ල.2)

(ආ)

- විද්‍යුත් වාණිජ කටයුතු සඳහා
- භාණ්ඩ සේවා පිළිබඳ ප්‍රචාරණයට
- තරඟකරුවන්ගේ තොරතුරු ලබාගැනීමට
- තම වෙළඳපොල කොටස ව්‍යාප්ත කරගැනීමට
- තොරතුරු පහසුවෙන් හා වේගවත්ව ලබාගැනීමට
- සමාජ ජාල ඔස්සේ ව්‍යාපාර කටයුතු කිරීමට (ල.2)

IV (අ)

- පැහැදිලි ඉම
- ගනුදෙනුකරුවන්
- ඉලක්ක
- අවශ්‍ය මූල්‍ය සම්පත්

(ල.2)

(ආ)

- ඉදිරි මෙහෙයුම් කටයුතු පිළිබඳව කල් තබා අවබෝධයක් ලබාගත හැකිවීම
- නිෂ්පාදනයේ ගුණාත්මකභාවය ඉහළ නංවාගත හැකිවීම
- නිෂ්පාදන කාර්යයේදී ඇතිවන අපතේ යාම, ප්‍රමාද වීම අවම කරගත හැකිවීම
- නිෂ්පාදන ඒකකයක පිරිවැය කල්තබා නිශ්චය කරගත හැකිවීම

(ල.2)

V (අ) සාමූහික සමාජ වගකීම් සංකල්පයට අනුව ව්‍යාපාර ආයතන වල අපද්‍රව්‍ය හා පරිසර දූෂණය අවම කිරීම සඳහා ප්‍රශස්ථ ක්‍රියාවලියකට යොමු වෙමින් විවිධ වැඩසටහන් වලට අනුග්‍රහය දක්වමින් මානව සම්පතින් උපරිම ඵල ලබාගැනීමට ක්‍රියාකිරීම හා ප්‍රජාව හා පරිසරය වෙනුවෙන් වගකීමක් සහිතව කටයුතු කිරීම SR සංකල්පයෙන් අදහස් වේ.

(ල.2)

(ආ) * විධායක සාරාංශය සමස්ත ව්‍යාපාර සැලැස්ම පිළිබඳව පෙර දැක්මක් ඇතිකිරීම
*ව්‍යාපාර සැලැස්ම පිළිබඳව මගපෙන්වීමක් ලබාදීම
*ව්‍යාපාර සැලැස්ම පිළිබඳව විශ්වාසයක් ඇති කිරීම


(ල.2)

LOL
Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

25% OFF
ALL BOOKS

**Including Exercise Books,
CR Books, and B5 Books**



ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්

ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

Cash On Delivery Available

ORDER A/L TERM TEST PAPERS, SHORT NOTES, WORKBOOKS & REVISION BOOKS

SINHALA, ENGLISH & TAMIL MEDIUM



LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

0717774440 (WHATSAPP)

WWW.LOL.LK